**වාණිජ්‍ය මූල්‍ය ගනුදෙනුද ඇතුලත්ව ආයතනික අන්තර්ජාල බැංකුකරණය (CIB) සඳහා බලපැවැත්වෙන කොන්දේසි හා නියමයන්**

සීමාසහිත කාගිල්ස් බැංකුව, ආයතනික අන්තර්ජාල බැංකුකරණය (CIB) සඳහා අන්තර්ජාල බැංකුකරණය සහ ගනුදෙනු සේවාවන් සැපයීම වෙනුවෙන් වෙබ් අඩවියක හිමිකාරිත්වය දරමින් එය මෙහෙයවීම හා පවත්වාගෙන යාමද සිදු කරනු ලබයි. මෙම වෙබ් අඩවිය, කාගිල්ස් බැංකුව හා එහි අනුබද්ධිත ආයතන (එක්ව 'කාගිල්ස් බැංකුව' ලෙස හැඳින්වේ) සහ සේවාදායකයින් අතර ගනුදෙනු සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කරයි. වෙබ් අඩවිය හරහා පිරිනමනු ලබන භාණ්ඩ හා සේවාවන් සඳහා අන්තර්ජාල හරහා ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, තොරතුරු, පුවත්, ග්‍රහණය කර ගැනීමේ උපකරණ, ගණක යන්ත්‍ර, අවදානම් අවම කිරීම් ඇතුලත්වන නමුත් ඊට සීමා නොවේ.

## 1. අර්ථ දැක්වීම්

මෙම ලේඛනයෙහි පහත සඳහන් යෙදුම් සඳහා, සන්දර්භය විසින් වෙනත් ආකාරයකින් අර්ථ නොදක්වන්නේ නම් එම යෙදුම් සඳහා ඉදිරියේ දක්වා ඇති අර්ථයන් පවතිනු ඇත.

1. **"කාගිල්ස් බැංකුව"** යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති වලට යටත්ව සංස්ථාගත කරන ලද්දා වූද (ලියාපදිංචි අංක PB 4847), ලියාපදිංචි කරන ලද ස්වකීය කාර්යාලය අංක 696, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ස්ථානයේ පිහිටා ඇත්තා වූද  සීමාසහිත කාගිල්ස් බැංකුව අදහස් වන අතර එහි අනුප්‍රාප්තිකයන් හා භාරකරුවන්ද ඇතුලත් වේ.

2. කාගිල්ස් බැංකුව හා **"අනුබද්ධිත"** යන්නෙන්, (අ) කාගිල්ස් බැංකුවෙහි භාරකාර සමාගම හෝ අනුබද්ධිත ආයතනයක් වන ඕනෑම සමාගමක්; හෝ (ආ) කාගිල්ස් බැංකුවෙහි පාලනය යටතේ හෝ බැංකුව සමග පොදු පාලනය යටතේ සිටින පුද්ගලයෙකු; හෝ (ඇ) කාගිල්ස් බැංකුව සතුව ඍජු හෝ ඵලදායී බැඳියාවක් හෝ පාලනයක් සහිත 26%ක හෝ ඊට වැඩි වැය ශීර්ෂ සුරැකුම්පත් සහිත ඕනෑම පුද්ගලයෙකු ඇතුලත් වන අතර අදහස්ද වේ. අනුබද්ධිත යන්න අර්ථදැක්වීමේ අරමුණ සඳහා ඕනෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් ව්‍යාකරණමය වෙනස්කම් සහිතව "පාලනය" යන්න මගින් ඍජුව හෝ වක්‍රව, කොන්ත්‍රාත්තුවක් මගින් හෝ කුමන හෝ ආකාරයකින් වැය ශිර්ෂ සහිත සුරැකුම්පත් සඳහා ඇති අයිතිය හරහා හෝ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සාමාජිකයෙකු(සාමාජිකයන්) පත් කිරීමට ඇති අයිතිය හරහා එවැනි පුද්ගලයෙකුගේ කළමනාකරණය හා ප්‍රතිපත්ති මෙහෙයවීම සඳහා ඇති බලය අදහස් වන අතර "පුද්ගලයා" මගින්

සමාගමක්, සංස්ථාවක්, හවුල් ව්‍යාපාරයක්, භාරයක් හෝ වෙනත් ඕනෑම ආයතනයක් හෝ සංවිධානයක් හෝ කුමන හෝ වෙනත් මණ්ඩලයක් අදහස් වේ.

3. "ගිණුම" යන්නෙන්, අන්තර්ජාලය හරහා ලබා දී ඇති සේවාවන් ක්‍රියාත්මක කිරීමට සුදුසු ගිණුමක් (ගිණුම්) ලෙස කාගිල්ස් බැංකුව විසින් නම් කරන ලද, පාරිභෝගිකයා සතු ජංගම ගිණුමක් සහ/හෝ වෙනත් ඕනෑම වර්ගයේ ගිණුමක් අදහස් වේ. අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් සඳහා යොදාගනු ලබන ගිණුම (ගිණුම්), අදාළ පාරිභෝගිකයාගේ නමින් පැවතිය යුතුය.

4. "සේවාදායකයා" යන්නෙන්, තනි හා බහු මුදල් හුවමාරු (SLIPS / CEFT) සහ ඒ හා සමාන වෙනත් සේවාවන් (මින් මතුවට අන්තර්ජාලය හරහා ලබා දෙන සේවාවන් ලෙස හැඳින්වෙන) ඇතුළුව, ආයතනික අන්තර්ජාල බැංකුකරණ යටතේ කාගිල්ස් බැංකුවෙහි අන්තර්ජාල බැංකුකරණ සහ ගනුදෙනු සේවාවන් ලබා ගන්නා සීමිත වගකීම් සමාගමක් (පුද්ගලික හා රාජ්‍ය ඇතුළුව), හවුල්කාර සමාගමක්, සමාජයක්, සමිතියක්, සංගමක්, රාජ්‍ය නොවන සංවිධානයක්, තනි අයිති සමාගමක් සහිත ව්‍යාපාරික පාරිභෝගිකයෙකු අදහස් වේ.

**"CEFT"** - The Common Electronic Fund Transfer System යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය හා මගපෙන්වීම යටතේ Lanka Clear පුද්ගලික සමාගම විසින් මෙහෙයවනු ලබන, ශ්‍රී ලංකාවේ විශ්වාසනීය ජාතික ගෙවීම් ජාලයේ කොටසකි. CEFT මගින් වසරේ දින 365 පුරා සතියේ දින 7 දීම ඉලෙක්ට්‍රොනික ගෙවීම් සිදු කල හැකි අතර තත්පර කිහිපයක් තුලදී ගෙවීම් සිදු වන ලෙස බැංකු ගනුදෙනුකරුවන් හට දිනයේ ඕනෑම වේලාවකදී ATM, ජංගම දුරකථන, අන්තර්ජාලය ආදිය භාවිතයෙන් බැංකුකරණ වේලාවෙන් පිටතදී වුවද, එම අවස්ථාවේදීම සිදු කරනු ලබන බැංකු මුදල් හුවමාරුවක් ලෙස ශ්‍රී ලංකා රුපියල් සිට ශ්‍රී ලංකා රුපියල් වෙතම සිදු කරනු ලබන ගනුදෙනු (රුපියල් මිලියන 5ක උපරිමයක් දක්වා පමණි) ක්‍රියාත්මක කිරීමට හැකි වීම සඳහා Lanka Pay-CEFT සාමාජිකයින් අතර අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන තත් කාලීන මුදල් හුවමාරු කිරීම්/ ගෙවීම් සිදු කිරීමට සහය වේ.

"**SLIPS**" – Sri Lanka Inter Bank Payment System යනු Lanka Clear පුද්ගලික සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු යාන්ත්‍රණයක් වන අතර SLIPS මුදල් හුවමාරු මූලිකව සැලසුම් කර ඇත්තේ, එක් ගනුදෙනුවක් සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 5ක උපරිමයක් දක්වා වන අඩු වටිනාකම් ගෙවීම් සඳහාය.

5. **"සේවාදායක තොරතුරු"** යන්නෙන් සේවාදායකයා විසින් ලබා ගන්නා ලද හෝ ලබා ගැනීමට යෝජනා කරන ලද ඕනෑම අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවක් හා සම්බන්ධව කාගිල්ස් බැංකුව මගින් ලබාගත්, සේවාදායකයා පිලිබඳ තොරතුරු අදහස් වේ.

6. **"සේවාදායක හැඳුනුම" හෝ "පරිශීලක හැඳුනුම"** යන්නෙන් ආයතනික අන්තර්ජාල බැංකුකරණය භාවිතයෙන් කාගිල්ස් බැංකුව සමග පවතින ගිණුම් වෙත ප්‍රවේශ වීම සඳහා කාගිල්ස් බැංකුව විසින් සේවාදායකයාට ලබා දුන් පරිශීලක හැඳුනුම අදහස් වේ.

7. **"සේවාදායක / පරිශීලක මුරපදය"** යන්නෙන් සේවාදායකයා / පරිශිකලයා විසින් ගනුදෙනු සිදු කිරීම, ආරම්භ කිරීම, බලය ලබා දීම සත්‍යාපනය කිරීම සඳහා කාගිල්ස් බැංකුව මගින් කලින් කලට නියම කරනු ලබන සේවාදායකයා වෙත ලබා දෙන / ලබා දීමට ඉල්ලුම් කරන මුරපදය හෝ වෙනත් සහතික කිරීමේ මාධ්‍යයක් අදහස් වේ.

8. **"පුද්ගලික තොරතුරු"** යන්නෙන් අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් සඳහා කාගිල්ස් බැංකුව විසින් කලින් කලට ලබා දෙන අයදුම්පතෙහි සේවාදායකයා විසින් කාගිල්ස් බැංකුව වෙත සපයනු ලබන ඕනෑම තොරතුරක් අදහස් වේ.

9. **"ගනුදෙනුව"** යන්නෙන් කොටස්, සුරැකුම්පත්, ව්‍යවහාර මුදල් හෝ වෙනත් ඕනෑම මූල්‍ය, ෆිස්කල් සහ මුල්‍යමය නිත්‍යානුකූල ලේඛනයක් හෝ කාගිල්ස් බැංකුව මගින් පාරිභෝගිකයන්ට හෝ කාගිල්ස් බැංකුව හා පාරිභෝගිකයන් අතර දැනට පවතින හෝ ලබා ගෙන ඇති හෝ මින් අනතුරුව ලබා ගැනීමට හෝ ලබා දීමට නියමිත බැංකුකරණ හෝ වෙනත් සේවාවන් මිලදී ගැනීම හෝ විකිනීම සඳහා සිදු කරනු ලබන ඕනෑම ගනුදෙනුවකි. කාගිල්ස් බැංකුව මගින් කලින් කලට වෙනත් ගනුදෙනු සඳහා අවසර ලබා දීමට හෝ දැනට පවතින ගනුදෙනු අත්හිටුවීමට අවශ්‍ය තීරණ ගනු ඇති අතර ඒ පිළිබඳව කාගිල්ස් බැංකුව මගින් තීරණය කරනු ලබන ආකෘතියකින් හෝ ආකාරයකින් සන්නිවේදනය කරනු ඇත.

10. **"පරිශීලකයා"** යන්නෙන් සේවාලාභියාගේ නියෝජිතයෙකු වශයෙන් අන්තර්ජාලය හරහා සපයනු ලබන සේවාවන් සැබවින්ම ක්‍රියාත්මක කිරීම සඳහා සේවාලාභියා විසින් බලය පවරනු ලබන පුද්ගලයෙකු අදහස් වේ. සේවාදායකයා සමාගමක් වන අවස්ථාවකදී, අධ්‍යක්ෂක මණ්ඩලය මගින්ද, සේවාදායකයා සමාගමක් හැර වෙනත් සංස්ථාපිත ආයතනයක් වන අවස්ථාවකදී එම

සංස්ථාපිත ආයතනය මත ප්‍රමාණවත් කළමනාකරණ හා පාලන බලය හිමි පාලක සමූහය මගින්ද නිශ්චිත පුද්ගලයෙකු/පුද්ගලයන් (මින් මතුවට පාරිශීලකයා ලෙස හඳුන්වනු ලැබේ) වෙත බලය පවරනු ඇති අතර සේවාදායකයා සඳහා සහ ඔහු වෙනුවෙන් , අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් වෙත ප්‍රවේශ වීමට බලය පැවරීම, අදාළ අවස්ථාවට අනුව අධ්‍යක්ෂක මණ්ඩල යෝජනාවකට, ඇටර්නි බලයකට හෝ අධිකරණ විධානයකට අනුව කාගිල්ස් බැංකුව සමග ලියාපදිංචි කරනු ඇත. කාගිල්ස් බැංකුව මගින් පරිශීලකයා වෙත කරනු ලබන ඕනෑම නිවේදනයක් සේවාදායකයා වෙතද නිවේදනය කරනු ලැබූ බවට සලකනු ලැබේ. ඒ හා සමානවම, කාගිල්ස් බැංකුව විසින් ලබා දෙනු ලබන අන්තරජාලය හරහා ලබාදෙනු ලබන සේවාවන් හරහා පරිශීලකයා විසින් සිදුකරන ඕනෑම නිවේදනයක් සහ/හෝ ක්‍රියාවක් සඳහා සේවාදායකයා නීත්‍යානුකූලව බැඳී සිටිනු ඇත.

11. **"වෙබ් අඩවිය"** යන්නෙන් කාගිල්ස් බැංකුව මගින් අන්‍යෝන්‍ය වශයෙන් සිය සේවාලාභින් හට අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් ලබා දීම සඳහා හිමිකාරිත්වය, මෙහෙයුම් හා පවත්වාගෙන යාම සිදු කරනු ලබන www.cargillsbank.com යන වෙබ් අඩවිය අදහස් වේ. මෙම වෙබ් අඩවිය, සීමාසහිත කාගිල්ස් බැංකුව සහ ඒ හා අනුබද්ධිතයන් (සාමූහිකව ගත කල කාගිල්ස් බැංකුව ලෙස හැඳින්වෙන) හා සේවාදායකයන් අතර ගනුදෙනු සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කරයි. වෙබ් අඩවිය හරහා ලබා දෙනු ලබන නිශ්පාදන හා සේවාවන් සඳහා අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන ගනුදෙනු සැකසීම සහ තොරතුරු, පුවත්, ග්‍රහණය කර ගැනීමේ උපකරණ, ගණක හා අවදානම් අවම කිරීම වැනි විශ්ලේෂණ විධි ඇතුලත් වන අතර ඊට සීමා නොවේ.

12. **"ආයතනික අන්තර්ජාල බැංකුකරණය"** යනු කාගිල්ස් බැංකුව මගින් ලබා දෙන අන්තර්ජාල බැංකුකරණ සේවාවෙහි වෙළඳ නාමයයි. ඒ සඳහා ආයතනික අන්තර්ජාල බැංකුකරණය, අන්තර්ජාල බැංකුකරණය හෝ අන්තර්ජාලය හරහා ලබා දෙන බැංකුකරණ සේවාවන් යන වචන ඛණ්ඩයන් මෙම ලේඛනය තුල හුවමාරු වෙමින් භාවිතා කර ඇත.

13. **"ආයතනික අන්තර්ජාල බැංකුකරණ සේවාවන්"** හෝ **"අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන බැංකුකරණ සේවාවන්"** හෝ **"අන්තර්ජාල බැංකුකරණය"** යන්නෙන් කාගිල්ස් බැංකුව මගින් කලින් කලට කාගිල්ස් බැංකුවෙහි සේවාදායකයන් හට භාණ්ඩ හා සේවාවන් සමගින් අන්තර්ජාලය ඔස්සේ ලබා දී ඇති ගිණුම් තොරතුරු වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබා ගැනීම, ගනුදෙනු සැකසීම ආදිය සඳහා ලබා දී ඇති කාගිල්ස් බැංකු අන්තර්ජාල සේවාවන් අදහස් වේ.

14. "OTP" යන්නෙන් එක් ගනුදෙනුවකට හෝ එක් වාරයකට පමණක් භාවිතා කල හැකි ස්වයංක්‍රීයව ජනනය වන සංඛ්‍යා හෝ අක්ෂර වලින් යුත්, පරිශීලකයා සත්‍යාපනය කරනු ලබන එක් වරක් පමණක් භාවිතා කල හැකි මුරපදය හැඳින්වේ.

**1. අර්ථකථනය**

සියලුම ඒකවචන යෙදුම් නිර්දේශයන්ට බහුවචන යෙදුම්ද ඊට ප්‍රතිලෝමවද අර්ථදැක්වෙන අතර "ඇතුලත් වේ" ලෙස සඳහන් කර ඇති අවස්ථාවලදී "සීමාවකින් තොරව" ඇතුලත්වන බව තේරුම් ගත යුතුය. සියලුම ගනුදෙනු, අන්තර්ජාල බැංකුකරණ කොන්දේසි හා නියමයන් සහ සියලුම නියම කර ඇති වෙනත් කොන්දේසි හා නියමයන් එක්ව කියවිය යුතු අතර ඒ සියල්ලට යටත් වේ. මෙම ලේඛනයෙහි, සේවාදායකයා සහ / හෝ පරිශීලකයා ලෙස හඳුන්වා ඇති පුරුෂකාරක පදයන්ගෙන් ස්ත්‍රීකාරක පදයන්ද අදහස් වේ.

**2. ආයතනික අන්තර්ජාල බැංකුකරණ සේවාවන්**

කාගිල්ස් බැංකුව, ගිණුම් ශේෂය පිලිබඳ තොරතුරු ලබා ගැනීම හා විමසීම, ගනුදෙනු පිලිබඳ විස්තර, ගිණුම් ප්‍රකාශන, මුදල් මාරු කිරීම් පිලිබඳ ඉල්ලීම්, වාණිජ්‍ය මූල්‍ය ගනුදෙනු සහ කාගිල්ස් බැංකුව විසින් කලින් කලට ලබා දීමට තීරණය කරනු ලබන එවැනි වෙනත් පහසුකම් වැනි ආයතනික බැංකුකරණ ආකෘතිය යටතේ අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන බැංකුකරණ හා ගනුදෙනු සේවාවන් සිය සේවාදායකයින් හට ලබා දීමට උත්සාහ දරයි. එමෙන්ම කාගිල්ස් බැංකුව, ආයතනික අන්තර්ජාල බැංකුකරණය යටතේ ලබා දෙනු ලබන සේවාවන් සඳහා අංග එකතු කිරීම් / ඉවත් කිරීම් සිය තනි අභිමතය පරිදි සිදු කරනු ඇත. එම අදාළ සේවාවන් භාවිතය සඳහා පැවතීම / නොපැවතීම, ඉලෙක්ට්‍රොනික් තැපැල (ඊමේල්), කාගිල්ස් බැංකු වෙබ් අඩවිය හෝ ලිඛිත සන්නිවේදනය මගින් දැනුම් දෙනු ඇත. අන්තර්ජාල බැංකුකරණ සේවාව හරහා සේවාදායකයින් හට ලබා දෙනු ලබන තොරතුරු අඛණ්ඩව යාවත්කාලීන නොකරන අතර ක්‍රමවත් කාලාන්තරයන්හිදී සිදු කරනු ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන් සේවාදායකයා හට අන්තර්ජාල බැංකුකරණ සේවාව හරහා ලබා දුන් ඕනෑම තොරතුරක්, එය සේවාදායකයාට සපයනු ලැබූ දිනය හා වෙලාවට අදාලව නොව, අවසන් වරට යාවත්කාලීන කරන ලද දිනය හා වේලාවට අදාලව පවතිනු ඇත. එවැනි තොරතුරු මත රඳා

පැවතීමෙන් හෝ ඒ මත ක්‍රියා කිරීමෙන්, සේවාදායකයා හට විඳීමට සිදු වන ඕනෑම අලාභයක් සඳහා කාගිල්ස් බැංකුව වග කියනු නොලැබේ.
කාගිල්ස් බැංකුව අන්තර්ජාල බැංකුකරණයේ කොටසක් ලෙස තුන් වන පාර්ශවයන් විසින් සම්පාදනය කල / ලබා දුන්, දත්ත / තොරතුරු / වාර්තා වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දෙනු ඇත. කාගිල්ස් බැංකුව එවැනි දත්ත / තොරතුරු / වාර්තා වල නිරවද්‍යතාවය පිලිබඳ නියෝජනයක් හෝ වගකීමක් ලබා නොදේ. තවද කාගිල්ස් බැංකුවේ (අවස්ථාවට අනුව) සහ තුන්වන පාර්ශවයේ පූර්ව අනුමැතියකින් තොරව සේවාදායකයා විසින් එම දත්ත / තොරතුරු / වාර්තා හෝ ඒවායේ ඕනෑම කොටසක් ව්‍යාප්ත කිරීම / පල කිරීම හෝ බෙදා හැරීම නොකල යුතුය. කාගිල්ස් බැංකුව හට සිය ගනුදෙනු පිලිබඳ වාර්තාවන් සිය අභිමතය පරිදි ඕනෑම ආකාරයෙකින් තබා ගැනීමේ හැකියාව පවතී. කිසියම් ගැටළුවක් ඇති අවස්ථාවකදී, කාගිල්ස් බැංකුව සතු වාර්තා නිරවද්‍ය නොවන හෝ අසම්පූර්ණ බවට පැහැදිලි සාක්ෂි නොමැති විට, ආයතනික අන්තර්ජාල බැංකුකරණය හරහා සිදු කරනු ලැබූ ගනුදෙනු පිලිබඳ කාගිල්ස් බැංකුවෙහි වාර්තා තීරණාත්මක හා සුදුසුම සාක්ෂි ලෙස සැලකිය යුතුය.

ආයතනික අන්තර්ජාල බැංකුකරණයෙහි කොටසක් ලෙස අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන ඕනෑම සේවාවක් සඳහා වන ඕනෑම ඉල්ලීමක් සහ සියලුම කොන්දේසි හා නියමයන්, එම ඉල්ලීම කාගිල්ස් බැංකුව වෙත ලැබුණු අවස්ථාවේ සිටම සේවාදායකයා සමග බැඳී පවතී.

ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවක් හා සම්බන්ධ අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවක් සඳහා වන ඕනෑම ඉල්ලීමක් සේවාලාභියා විසින් සිදු කරනු ලැබූ අවස්ථාවකදී, කාගිල්ස් බැංකුව විසින් සඳහන් කරන ලද විනිමය අනුපාතිකයන් තාවකාලික අනුපාතිකයන් පමණක් වන අතර අනාගතයේදී විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම් වලට භාජනය විය හැකිය. ගනුදෙනුව ලබා දෙනු ලබන අනුපාතිකය, සියලුම අභිප්‍රායන් හා අරමුණු සඳහා අදාළ වන අනුපාතිකය වේ.

කාගිල්ස් බැංකුව සතුව මේ වන විට පවතින තාක්ෂණය යොදාගනිමින්, ආයතනික අන්තර්ජාල බැංකුකරණය සඳහා උපරිම ආරක්ෂාවක් ලබා දීමට සහ ඒ වෙත අනවසර ප්‍රවේශයන් සිදු වීම වලක්වාලීමට කාගිල්ස් බැංකුව සියලු සාධාරණ පියවර ගනු ලැබේ.

ආයතනික අන්තර්ජාල බැංකුකරණය හෝ ඊට අදාළ සේවාවක්, නිත්‍යානුකූල නොවන හෝ කොන්දේසි හා නියමයන්ට අදාලව අවසර නොලත් හෝ අවිධිමත් ඕනෑම අරමුණක් සඳහා යොදා නොගන්නා බවට සේවාදායකයා සහතික විය යුතුය.

## 3. අන්තර්ජාල සේවා වෙත ප්‍රවේශ වීම

කාගිල්ස් බැංකුව සිය අභිමතය පරිදි තෝරාගත් සේවාලාභීන් වෙත අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් පිරිනමනු ඇත. සේවාදායකයා, අන්තර්ජාලය භාවිතා කරන්නෙකු හෝ අන්තර්ජාලය වෙත නීතිමය ප්‍රවේශයක් සහිත අයෙකු සහ අන්තර්ජාලය ක්‍රියා කරනු ලබන ආකාරය පිලිබඳ දැනුම සහිත අයෙකු විය යුතුය. කාගිල්ස් බැංකුව, අන්තර්ජාල සේවාවන් වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය වන අන්තර්ජාල මෘදුකාංගයන් (Browser වැනි) පිළිබඳව කලින් කලට උපදෙස් සපයනු ඇත. මෙම අන්තර්ජාල මෘදුකාංගයේ සියලුම අනුවාදනයන් සඳහා සහය වීමට කාගිල්ස් බැංකුව බැඳී නොසිටිනු ඇත.

## 4. නිවේදන

කාගිල්ස් බැංකුව සහ සේවාදායකයා හට පහත දක්වා ඇති ආකාරන් යටතේ නිවේදන ලබා දිය හැක : ලිඛිතව සඳහන් කර අතින් ගෙනවිත් භාර දීම හෝ තැපැල මගින් එවීම හෝ ෆැක්ස් මාර්ගයෙන් සේවාදායකයා විසින් අවසන් වරට ලබා දුන් ලිපිනය හෝ ෆැක්ස් අංකය වෙත හෝ කාගිල්ස් බැංකුව වෙත ලබා දීමකදී, සීමාසහිත කාගිල්ස් බැංකුව, අංක 696, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට එවීමෙන්.  මීට අමතරව, සියලුම සේවාදායකයන්ට අදාළ වන නිවේදනයන් කාගිල්ස් බැංකුව විසින් සිය වෙබ් අඩවිය ඔස්සේ පොදු නිවේදනයක් ලෙස පල කරනු ඇත. එක් එක් සේවාදායකයා වෙත වෙන වෙනම ලබා දුන් නිවේදනයන්හි ඇති බලපෑමට සමාන වූ බලපෑමක් මෙවැනි නිවේදනයන්ද සතු වේ.

## 5. සහතික කිරීමේ ක්‍රියාවලිය

5.1 ඒ සඳහා ලබා දෙනු ලබන සේවාදායක / පරිශීලක මුරපදය, සේවාදායකයාගේ ගිණුම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දෙනු ලබන අතර එහි තනි හා පරම හිමිකරු සහ සේවාදායක / පරිශීලක මුරපදය භාවිතා කිරීම සඳහා එකම අවසරලත් පරිශීලකයා වන්නේ සේවාදායකයා වන අතර සේවාදායක / පරිශීලක මුරපදය භාවිතා කිරීම, රහස්‍යභාවය හා ආරක්ෂා කර ගැනීම මෙන්ම එම සේවාදායක / පරිශීලක මුරපදය භාවිතයෙන් සේවාදායකයාගේ ගිණුම වෙත සිදු කරනු ලබන සියලුම විධානයන් සහ තොරතුරු වල වෙනස් කිරීම් සඳහා පරම වගකීම සේවාදායකයා විසින්

භාර ගත යුතුය. සේවාදායක / පරිශීලක මුරපදය මගින් ගනුදෙනු සිදු කිරීම සහ ලබා දෙනු ලබන උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා සේවාදායකයා විසින් කාගිල්ස් බැංකුව වෙත ක්ෂණික අවසරයක් ලබා දෙනු ලබන අතර එවැනි ගනුදෙනු හා උපදෙස් සඳහා සේවාදායකයා බැඳී සිටී.

සේවාදායක / පරිශීලක මුරපදය සම්බන්ධයෙන් කාගිල්ස් බැංකුව විසින් කලින් කලට නිර්දේශය කරනු ලබන එවැනි මාර්ගෝපදේශ, උපදෙස් හෝ කොන්දේසි සමග සේවාදායකයා එකඟ විය යුතු වේ.

5.2 නිසි සහතික කිරීමක් සඳහා නියම කර ඇති අවශ්‍යතාවයන් සමග සේවාදායකයා එකඟ වී තහවුරු කල යුතුය: ගනුදෙනු සිදු කිරීම සඳහා අවශ්‍ය වන නිර්දේශිත සනාථ කිරීමේ තාක්ෂණයන් සහ ආරක්ෂක ක්‍රියාමාර්ගයන් තහවුරු කිරීමට සහ සේවාදායක / පරිශීලක මුරපදය කිසිදු තුන්වන පාර්ශවයකට හෙළිදරව් නොකිරීමට සියලු සාධාරණ පියවර ගැනීමට කටයුතු කරන බවට සේවාදායකයා එකඟ වේ.

I. ප්‍රථම අවස්ථාවේදී කාගිල්ස් බැංකුව විසින් පරිශීලකයාහට පරිශීලක හැඳුනුමක් සහ රහස්‍ය සේවාදායක / පරිශීලක මුරපදයක් ලබා දෙනු ඇත. කාගිල්ස් බැංකුව විසින් ලබා දෙනු ලබන සේවාදායක / පරිශීලක මුරපදය, ප්‍රථම අවස්ථාවේදී සේවාලාභියා / පරිශීලකයාගේ ගිණුමට ප්‍රවේශ වීම සඳහා අවස්ථාව සලසනු ලබන පෙරනිමි (default) මුරපදයක් වන අතර ප්‍රථම වරට අන්තර්ජාල සේවාවන් වෙත ප්‍රවේශ වූ අවස්ථාවේදී කාගිල්ස් බැංකුව විසින් ලබා දෙනු ලැබූ එම සේවාදායක / පරිශීලක මුරපදය වෙනස් කිරීමට අවශ්‍ය වේ. ආරක්ෂක පියවරක් ලෙස සේවාදායකයා / පරිශීලකයා විසින් සේවාදායක / පරිශීලක මුරපදය හැකි සෑම විටකම වරින් වර වෙනස් කල යුතුය. කාගිල්ස් බැංකුවෙහි අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් මගින් සාර්ථක ගනුදෙනුවක් සිදු කිරීම සඳහා සේවාදායකයාගේ පරිශීලකයන් (සේවාදායකයාගේ අවශ්‍යතාවය මත අධිකාරීන් සංඛ්‍යාව තීරණය වේ) විසින් ආදානය (input) කර බලය පැවරිය යුතු අතර ගනුදෙනුව සම්පූර්ණ වන්නේ සේවාදායකයාගේ පරිශීලකයා විසින් පරිශීලක හැඳුනුම හා මුරපදය නිවැරදිව ඇතුලත් කල පසුව පමණි. නිරවද්‍ය නොවූ මුරපදයක් නොකඩවා තුන්වරක් (3) ඇතුලත් කරනු ලැබූ අවස්ථාවකදී සේවාදායක / පරිශීලක හැඳුනුම සහ මුරපදය අවහිර වන අතර සේවාදායකයා / පරිශිලකයා විසින් සිය මුරපදය නැවත සකස් කිරීමට / නව මුරපදයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමට සිදු වනු ඇත.

II. සේවාදායක / පරිශීලක හැඳුනුම සහ සේවාදායක / පරිශීලක මුරපදය සුරක්ෂිතව තබා ගැනීම පිලිබඳ සම්පූර්ණ වගකීම සේවාදායකයා සතු වන අතර ඒවායේ අනිසි භාවිතය නිසාවෙන් සිදුවන හානි හා වෙනත් ප්‍රතිවිපාකයන් සඳහාද වගකිව යුතුය. පූර්ව ආරක්ෂක පියවරක් ලෙස, නිරවද්‍ය නොවූ සේවාදායක / පරිශීලක හැඳුනුමක් හෝ සේවාදායක / පරිශීලක මුරපදයක් තුන්වරක් (3) ඇතුලත් කිරිමෙන් පසුව, අන්තර්ජාල බැංකුකරණ සේවාව සමග ඇති සබැඳියාවට බාධා වනු ඇත.

III. සේවාදායක / පරිශීලක හැඳුනුමෙහි හා සේවාදායක / පරිශීලක මුරපදයෙහි රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීම පිලිබඳ සේවාදායකයා විසින් සැලකිල්ලක් දැක්විය යුතුය. තුන්වන පාර්ශවයක් විසින් සේවාදායකයාගේ ගිණුම ඇතුලු සේවාවන් වෙත ප්‍රවේශ වීමක් සිදු වුව හොත් සේවාදායකයා ඒ සඳහා සම්පූර්ණ වගකීම භාරගත යුතු වන අතර එමගින් පැනනැගිය හැකි ඕනෑම ප්‍රතිවිපාකයක් හේතුවෙන් එවැනි ප්‍රවේශවීම් හා භාවිතයන් මත පදනම්ව හෝ ඊට අදාලව,එවැනි තුන්වන පාර්ශවන්ද ඇතුලත්ව එහෙත් ඊට සීමා නොවී ඕනෑම පුද්ගලයෙකු විසින් සිදු කරනු ලබන හිමිකම් පෑමක් හෝ නෛතික ක්‍රියාමාර්ගයන හේතුවෙන් කාගිල්ස් බැංකුව වෙත ඇතිවන හෝ විඳීමට සිදු වන ඕනෑම වගකීමකට, අලාභයකට හෝ පාඩුවකට එරෙහිව කාගිල්ස් බැංකුව වෙත වන්දි පූරණය කල යුතු වේ.

IV. සේවාදායකයාගේ මුරපදය සත්‍යාපනය කිරීමකට අමතරව, අන්තර්ජාලය භාවිතයෙන් හෝ වෙනත් ආකාරයකින් සේවාදායකයා විසින් යවනු ලබන හෝ යැවීමට අදහස් කරන ගනුදෙනු උපදෙස් වල සත්‍යතාවය තහවුරු කිරීමට කාගිල්ස් බැංකුවහට කිසිඳු වගකීමක් නොමැත. සේවාදායකයාගේ ගිණුම් අධීක්ෂණය හා ආරක්ෂා කිරීම සහ ඒ හා සම්බන්ධ සියලුම ගනුදෙනු සඳහා සේවාදායකයා පූර්ණ වගකීම භාරගනී.

V. අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් හැර වෙනත් ඕනෑම ආකාරයකින් කාගිල්ස් බැංකුවෙහි පරිගණක තුල ගබඩා කර ඇති තොරතුරු සහ වෙනත් විස්තර වෙත ප්‍රවේශ වීමට පරිශීලකයා විසින් උත්සාහ නොදැරිය යුතු බවට සේවාදායකයා විසින් සහතික විය යුතුය. එමෙන්ම අනවසර පුද්ගලයින්හට සිය ගිණුමට (ගිණුම් වලට) ප්‍රවේශ වීමට අවසර නොමැති බවටද සේවාදායකයා විසින් සහතික විය යුතුය.

VI. කාගිල්ස් බැංකුව සමග පවතින තෙවන පාර්ශවයකට අයත් ගිණුම් සම්බන්ධව හෝ කාගිල්ස් බැංකුව හා ඕනෑම තෙවන පාර්ශවයක් අතර සිදුවන ගනුදෙනු සම්බන්ධව

කාගිල්ස් බැංකුවෙහි පරිගණක තුල ගබඩා කර ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා අන්තර්ජාලය හරහා ලබා දී ඇති සේවාවන්හි කොටසක් ලෙස ලබා දී ඇති පහසුකම්, පරිශීලකයා විසින් භාවිතා භාවිතා නොකළ යුතු බවට සේවාදායකයා විසින් සහතික විය යුතුය.

VII. සේවාදායක මුරපදය පවතින්නේ සේවාදායකයා විසින් සිදු කරනු ලබන ගනුදෙනුවෙහි සත්‍යතාවය තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවය සඳහා බවත් සේවාදායකයාගේ බලයලත් අත්සන්කරුවකුගේ අත්සනකට සමාන වූ බලපෑමක් ඇති බවත් සේවාදායක / පරිශීලක මුරපදය භාවිතයෙන් සිදු කරනු ලැබූ ගනුදෙනු සමග සේවාදායකයා බැඳී සිටින බවත් සේවාදායකයා විසින් තේරුම්ගෙන එකඟවේ.

VIII. පරිශීලකයා පහත පරිදි විය යුතු බවට කාගිල්ස් බැංකුව විසින් සේවාදායකයා වෙත උපදෙස් ලබා දෙනු ඇත.

a) සේවාදායක / පරිශීලක හැඳුනුම සහ සේවාදායක / පාරිශිලක මුරපදය රහසිගතව තබා ගත යුතු අතර සේවාදායක / පරිශීලක මුරපදය කිසිදු තුන්වන පාර්ශවයක් වෙත අනාවරණය නොකළ යුතුය.
b) අවම වශයෙන් අක්ෂර 6කින් යුතු සේවාදායක / පරිශීලක මුරපදයක් තෝරා ගත යුතු අතර එය සේවාදායකයාගේ නම, ලිපිනය, දුරකථන අංකය වැනි පහසුවෙන් ලබා ගත හැකි පුද්ගලික දත්ත හා සම්බන්ධ හෝ වෙනත් ඕනෑම අක්ෂර හා සංඛ්‍යාවන්හි පහසු සංයෝජනයක් නොවිය යුතුය.
c) සේවාදායක / පරිශීලක හැඳුනුම හා සේවාදායක / පරිශීලක මුරපදය, ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාර්ගයකින් වාර්තාගතව නොව සේවාදායකයාගේ / පරිශීලකයාගේ මතකයෙහි රඳවා ගෙන සිටිය යුතුය.
d) කිසිඳු අනවසර පුද්ගලයෙකුට සේවාදායකයාගේ පරිගණකය වෙත ඇතුලු වීමට ඉඩ නොදිය යුතු අතර, භාණ්ඩ සහ/හෝ සේවා වෙත හෝ වෙබ් අඩවිය වෙත ප්‍රවේශ වී තිබියදී පරිගණකය භාවිතයෙන් ඉවත් නොවිය යුතුය.
e) සේවාදායක / පරිශීලක හැඳුනුම හෝ සේවාදායක / පරිශීලක මුරපදය, පරිශීලකයා හට අමතක වුවහොත් හෝ අස්ථාන ගත වුවහොත් කාගිල්ස් බැකුව වෙත විධිමත් ලිඛිත ඉල්ලීමක් ලබා දීම මගින් සේවාදායකයා හට සේවාදායක / පරිශීලක මුරපදය වෙනස් කිරීමට ඉල්ලුම් කල හැක.

## 6. සේවාදායකයා විසින් ලබා දෙනු ලබන උපදෙස් ආදිය

සේවාදායක / පරිශීලක හැඳුනුම හා මුරපදය භාවිතයෙන් ඇතුලත් කරන ලද ඕනෑම උපදෙසක්, නියෝගයක්, විධානයක් හෝ ඉල්ලීමක්, සේවාදායකයා හෝ නිසි පරිදි බලයලත් නියෝජිතයෙකු හෝ සේවාදායකයා විසින් බලය පැවරූ නියෝජිතයෙකු විසින් ලබා දුන් උපදෙසක්, නියෝගයක්, විධානයක් හෝ ඉල්ලීමක් ලෙස සලකනු ලැබේ. සේවාලාභියා විසින් විද්‍යුත් හෝ වෙනත් ආකාරයකින් ඇතුලත් කරනු ලබන උපදෙස්, ඉල්ලීම්, නියම, විධාන, නියෝග සියල්ල සේවාදායකයාගේ තීරණ මත පදනම් වූ හෝ සේවාදායකයාගේ පරම වගකීම මත සිදු වේ. උපදෙසක්, විධානයක්, නියමයක්, ඉල්ලීමක් විද්‍යුත් හෝ වෙනත් ආකාරයකින් කාගිල්ස් බැංකුව වෙත ඇතුලත් කරනු ලැබීමෙන් එවැනි උපදෙස්, විධාන, නියමයන් හෝ ඉල්ලීමක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සහතික නොවන බව සේවාදායකයා තේරුම් ගත යුතුය. අවසාන අවසර ලබා දීමෙන් පසුව පද්ධතියෙහි "ගනුදෙනුව සාර්ථකයි" ලෙස පණිවිඩය සටහන් වන තෙක් සේවාදායකයා විසින් කාගිල්ස් බැංකුව වෙත විද්‍යුත් මාර්ගයෙන් ලබා දුන් කිසිදු උපදෙසක්, විධානයක්, නියමයක්, ඉල්ලීමක් ලැබුණු බවට සලකනු නොලැබේ.

## 7. ගාස්තු

ආයතනික අන්තර්ජාල බැංකුකරණය සහ සේවාවන් භාවිතා කිරීම සඳහා කාගිල්ස් බැංකුව විසින් සේවා ගාස්තු අය කරනු ඇති අතර එම ගාස්තු පිළිබඳ කාගිල්ස් බැංකුව විසින් කලින් කලට සිය පාරිභෝගිකයන් වෙත දැනුම්දෙනු ඇත. එම සේවා ගාස්තු වල යම් වෙනසක් සිදුවේ නම්, ඒ පිළිබඳවද පාරිභෝගිකයින් වෙත දැනුම්දීම සහ / හෝ බැංකුවෙහි වෙබ් අඩවියෙහි සඳහන් ගාස්තු විස්තර යාවත්කාලීන කිරීම සිදු වනු ඇත. කාගිල්ස් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන ආයතනික අන්තර්ජාල බැංකුකරණයට අදාල සියලුම ගාස්තු පාරිභෝගිකයාගේ ගිණුමකට හර කිරීම මගින් පියවා ගැනීමට පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව වෙත බලය ලබාදේ. ඕනෑම අවස්ථාවකදී තැන්පතු මුදල, ඉහත සඳහන් කල අවශ්‍ය අවම මුදල් ප්‍රමාණයට වඩා අඩු වුවහොත් සහ /හෝ සේවා ගාස්තු ගෙවා නොතිබුණහොත්, කාගිල්ස් බැංකුව විසින් පාරිභෝගිකයාහට පෙර දැනුම්දීමකින් තොරව සහ /හෝ එම ඉවත් කිරීම හේතුවෙන් කුමන ආකාරයේ හෝ කිසිදු වගවීමක් හෝ වගකීමක් දැරීමකින් තොරව මෙම ආයතනික අන්තර්ජාල බැංකුකරණ සේවාව ඉවත්කර ගනු ඇත.

## 8. මුදල් මාරු කිරීම

අදාළ ගිණුමෙහි ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් නොමැති අවස්ථාවන්හිදී හෝ කාගිල්ස් බැංකුව සමග ගනුදෙනුවට පෙර නියම කර ගන්නා ලද අයිරා පහසුකමක් ලබා ගැනීමට අවසර නොමැතිව පාරිභෝගිකයා විසින් ආයතනික අන්තර්ජාල බැංකුකරණ සේවාව හරහා මුදල් මාරු කිරීම හෝ එසේ කිරීමට උත්සාහ දැරීම නොකළ යුතුය. ආයතනික අන්තර්ජාල බැංකුකරණය හරහා ලැබෙන එවැනි මුදල් මාරු කිරීම්, අදාළ ගිණුමෙහි ප්‍රමාණවත් මුදලක් පවතීනම් පමණක් කාගිල්ස් බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරනු ඇත. කාගිල්ස් බැංකුවෙහි සාධාරණ පාලනයෙන් ඔබ්බට පවතින කරුණු හේතු කොට ගෙන, සියලුම හෝ යම් ගෙවීමකදී සිදු වන කිසිදු දෝෂයක් හෝ ප්‍රමාද වී ගෙවීමක් සඳහා කාගිල්ස් බැංකුව විසින් වගකියනු නොලැබේ.

පාරිභෝගිකයාහට මුදල් මාරු කිරීම පහසුකම ලබා දී ඇත්නම්, පාරිභෝගිකයාගේ ගිණුමෙන් කාගිල්ස් බැංකුව සහ / හෝ Lanka Clear (PVT) Limited හි ඉලෙක්ට්‍රොනික මුදල් මාරු කිරීමේ පද්ධතියට (Electronic Fund Transfer System – SLIPS සහ CEFT) යටතට අදාළ වන වෙනත් ඕනෑම බැංකුවක් සතුව පවතින එම පාරිභෝගිකයාටම හෝ තුන්වන පාර්ශවයකට අයත් වෙනත් ගිණුමක් වෙත මුදල් මාරු කිරීම සඳහා භාවිතා කල හැකිවේ. පාරිභෝගිකයා විසින් මේ හා සම්බන්ධව නිරූපිත වශයෙන් බලය ලබා දුන් පරිශීලකයෙකු සඳහා පමණක් මෙම මුදල් මාරු කිරීමේ පහසුකම මෙහෙයවීමේ හැකියාව පවතී. එවැනි පරිශීලකයෙකුහට ගිණුම් විවෘත කිරීමේ අයදුම්පත / පාරිභෝගිකයා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවට අනුකූලව ආයතනික අන්තර්ජාල බැංකුකරණය භාවිතයෙන් මුදල් මාරු කිරීමට අවසර දෙනු ඇත. පාරිභෝගිකයා විසින් ලබා දෙනු ලැබූ ගිණුම් විවෘත කිරීමේ අයදුම්පතෙහි මුදල් මාරු කිරීම සඳහා වන උපරිම සීමාවක් සඳහන් කල යුතුය. එමෙන්ම ශ්‍රී ලංකා මහා බැංකුව මගින් සීමාවන් පනවා ඇති SIA, OIA, MBA වැනි විශේෂිත ශ්‍රී ලංකා රුපියල් ගිණුම් වෙත මුදල් බැර කිරීමක් සිදු නොකිරීමට පාරිභෝගිකයා තව දුරටත් එකඟ වේ.

## 9. වෙළඳ මූල්‍යකරණ පොදු ගිවිසුම

### 9.1 අර්ථදැක්වීම්

**"ලේඛ බද්ධ ණයවර"** යනුවෙන් පාරිභෝගිකයාගේ ඉල්ලීම මත හෝ පාරිභෝගික ගිණුම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන හෝ තහවුරු කරනු ලබන ලේඛ බද්ධ ණයවර සහ එවැනි ණයවරයක් නිකුත්

කිරීම සඳහා බැංකුව විසින් සිදු කරනු ලබන ඕනෑම කැපවීමක් සහ පාරිභෝගිකයාගේ ඉල්ලීම මත එවැනි ණයවරයක් හෝ කැපවීමක් දීර්ඝ කිරීමක් හෝ සංශෝධනය කිරීමක් අදහස් වේ.

**"ලේඛන"** යනුවෙන් භාරකාරත්වය සඳහා හෝ වෙනත් හේතුවක් සඳහා සහ බැංකුකරණයට අයත් සාමාන්‍ය පටිපාටීන් තුල පවතින හෝ එසේ නොවන බැංකුවෙහි නම , හිමිකාරිත්වය හෝ පාලනය යටතේ හෝ බැංකුව විසින් පවතින හෝ බැංකුව විසින් පවත්වා ගෙන යන හෝ බැංකුවෙහි නියෝගය මත පවතින භාණ්ඩ හා / හෝ නිෂ්පාදනයන්ට සම්බන්ධ සියලුම බිල්පත්, හිමිකම් ලිපි ලේඛන, ප්‍රවාහන ලියකියවිලි, රක්ෂණ ඔප්පු සහ වෙනත් භාණ්ඩ සහ/හෝ නිෂ්පාදනයන්ට සම්බන්ධ ලේඛන අදහස් වේ.

**"විනිමය අනුපාතය"** යනුවෙන්

එක් ව්‍යවහාරික මුදල් ඒකකයක් වෙනත් මුදල් ඒකකයක් වෙත පරිවර්තනය කිරීම සඳහා අදාළ කාලයේදී අදාළ විදේශ විනිමය වෙළඳපොල තුල පවතින ලෙස බැංකුව විසින් නිර්ණය කරනු ලබන අනුපාතය අදහස් වන අතර එම නිර්ණය කරනු ලබන අනුපාතය ස්ථිර වන අතර ගනුදෙනුකරු වෙත බැඳී පවතී.

**"පහසුකම" සහ "පහසුකම්"** යනුවෙන් පාරිභෝගිකයාගේ ඉල්ලීම මත බැංකුව විසින් සිය පාරිභෝගිකයින් හෝ වෙනත් පුද්ගලයෙකු සඳහා අත්තිකාරම් වශයෙන්, ලේඛ බද්ධ ණයවර නිකුතුවක් ලෙස, නැව්ගත කිරීමේ ඇප හෝ වෙනත් අයුරකින් එහි අන්තර්ගත භාණ්ඩ හා සම්බන්ධ නිකුතුවක් ලෙස, ලබා දෙනු ලබන සහ නොකඩවා ලබා දෙන පහසුකම සහ පහසුකම් අදහස් වේ. එවැනි ඕනෑම පහසුකමක් සඳහා වන විශේෂිත නාමයන්, පාරිභෝගිකයා හා බැංකුව අතර හුවමාරු වන මූල්‍ය සහ/හෝ පහසුකම් සඳහා අදාළ වන ලේඛනයන්හි අදාළ පරිදි සඳහන් කරනු ඇත.

**9.2 අයදුම්පත**

9.2.01 මෙම ගිවිසුම, බැංකුව විසින් සුදුසු යයි සිතන ප්‍රමාණයට සහ අකාරයකට බැංකුවෙහි තනි අභිමතය පරිදි ලබා දීමට එකඟ වන ඕනෑම පහසුකමක් සඳහා අදාළ වේ.

9.2.02 මෙම ගිවිසුමෙහි සඳහන් කොන්දේසි හා නියමයන්, ඕනෑම තනි ලේඛ බද්ධ ණයවරයක් සහ ඕනෑම සුවිශේෂී පහසුකමක් හා සම්බන්ධව බැංකුව විසින් නිරූපණය කරන ලද වෙනත් කොන්දේසි හා නියමයන්ට යටත් වේ.

9.2.03 සෑම ලේඛ බද්ධ ණයවරයක්ම, කලින් කලට බලපැවැත්වෙන ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයෙහි වාර්තාමය ණය සඳහා වන ඒකීය රේගුවට සහ ප්‍රතිපත්තීන්ට යටත් වේ.

9.2.04 මෙම ගිවිසුම සහ කලින් කලට බලපැවැත්වෙන ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයෙහි වාර්තාමය ණය සඳහා වන ඒකීය රේගුව සහ ප්‍රතිපත්තීන් සහ/හෝ කලින් කලට බලපැවැත්වෙන ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයෙහි අය කර ගැනීම් පිළිබඳ වන නීති රීති අතර යම් මත ගැටුමක් ඇති අවස්ථාවකදී මෙම ගිවිසුම බල පැවැත්විය යුතුය.

**9.3** **ආනයන සඳහා ලේඛ බද්ධ ණයවර**

**9.3.01** සෑම ලේඛ බද්ධ ණයවරක් යටතේම එහි නියමයන්ට යටත්ව ගෙන එනු ලබන අනුකූල ඉදිරිපත් කිරීමක් පිළිගැනීමට බැංකුවට බලය හිමිවේ.

**9.3.02** බැංකුව විසින් ඕනෑම ලේඛ බද්ධ ණයවරක් යටතේ සිදුවන ගනුදෙනු පිලිබඳ සාකච්ඡා කිරීම් එහි අනුරූපකයා හෝ ඔහුගේ නියෝගිතයෙකු හට සීමා කරනු ඇති අතර එවැනි අවස්ථාවකදී එවැනි කාර්යාලයක්, අනුරූපකයෙකු හෝ නියෝජිතයෙකු වෙනුවෙන් ලියන ලද හෝ ලිවීමට අදහස් කරන සියලුම ලේඛන පිළිගැනීමට හා ගෙවීම් සිදු කිරීමට බැංකුව වෙත බලය හිමි වේ.

**9.3.03** ඕනෑම ලේඛ බද්ධ ණයවරයක් යටතේ ගෙවිය යුතුව පවතින හිඟ මුදලට සමාන මුදලක් පාරිභෝගිකයා විසින් හිඟ මුදල් ගෙවිය යුතු දිනය පසු වීමට පෙර බැංකුව වෙත ගෙවිය යුතුය.

9.4 **අපනයන ලේඛන**

**9.4.01** බැංකුව විසින් ලේඛ බද්ධ ණයවරය තහවුරු කර ඇත්නම්, ඕනෑම හේතුවක් හෝ චෝදනාවක්, වංචාවක් (ඕනෑම පුද්ගලයෙකු හා සම්බන්ධ) හෝ වෙනත් ලේඛ බද්ධ ණයවරය සඳහා බලපාන නීති විරෝධී කරුණක් නිසාවෙන් සිදු වන ගෙවීම් සිදු නොකිරීමකදී එහි සම්පූර්ණ වගකීම බැංකුව විසින් පාරිභෝගිකයා වෙත ලබා දෙනු ඇත.

**9.4.02** 4.01 වගන්තියට යටත් නොවේ නම්, බැංකුව විසින් ලේඛ බද්ධ ණයවරය තහවුරු කර ඇත්නම්, බැංකුව විසින් ගනුදෙනු සාකච්ඡා කර හෝ අනුමතකර ඇති ලේඛ බද්ධ ණයවරය වෙනුවෙන් හෝ එසේ නොවන අන්දමින්, අගරු වූ හෝ නියමිත හිඟ මුදල් ගෙවීමේ දිනයට පෙර නොගෙවූ

බිල්පත් යටතේ ගෙවිය යුතුව පවතින හිඟ මුදලට සමාන මුදලක් හිඟ මුදල් ගෙවිය යුතු දිනය වන විට පාරිභෝගිකයා විසින් හිඟ මුදල් ගෙවිය යුතු දිනය පසු වීමට පෙර බැංකුව වෙත ගෙවිය යුතුය. කොන්දේසි විරහිතව බැංකුව වෙත සම්පූර්ණ හිඟ මුදල නොලැබුණේ නම්, හිඟ මුදල් ගෙවීම සිදු නොකළ බවට සලකනු ලැබේ.

**9.4.03** ලේඛ බද්ධ ණයවරයක් යටතේ ලියැවුණු හෝ එසේ නොවන ඕනෑම බිල්පතක් සම්බන්ධයෙන් සිය තනි අභිමතය පරිදි එවැනි අවස්ථාවකදී සුදුසු යයි සිතන ආකාරයට පහත පියවර ගැනීමට බැංකුවට බලය හිමි වේ.

a) කොන්දේසි සහිත පිළිගැනීමක් සහ / හෝ ගරු කිරීම සඳහා පිළිගැනීමක් සහ/හෝ ගෙවීම් සඳහා වන දිනය දීර්ඝ කිරීමක් සිදු කිරීම
b) අදාළ ගෙවීම් කරන්නා විසින් ගෙවීම් පිළිගැනීම හෝ කල්පිරීමට පෙර අඩු කිරීම් හෝ වට්ටම් යටතේ පිළිගැනිම
c) කල්පිරීමට පෙර ගෙවිය යුතු මුදලෙන් කොටසක් පිළිගැනීම සහ භාණ්ඩයන්ගෙන් සමානුපාතික කොටසක් අදාළ ගෙවීම් කරන්නා හෝ බිල්පත් පිලිගන්නන් හෝ භාණ්ඩ හා සම්බන්ධ නියෝජිතයා වෙත ලබා දීම
d) අදාළ ගෙවීම් කරන්නා ගේ ඉල්ලීම මත, බිල්පත් හා සම්බන්ධව්ව ගනුදෙනුකරු හට බැංකුව වෙත ඇති වගකීමට බලනොපාන ලෙස ගෙවීම් සඳහා හෝ පිළිගැනීම සඳහා වන ඕනෑම බිල්පතක් ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම
e) යම් බිල්පතකට අදාළ මුදල් ප්‍රමාණය බැංකුව විසින් ගනුදෙනුකරුගේ ගිණුමට හර කරනු ලැබුවද, ප්‍රතිග්‍රාහකයින්ගෙන් හෝ බිල්පත් අනුමත කරන්නන්ගෙන් යම් බිල්පතක් සඳහා ගෙවිය යුතු ඕනෑම මුදලක් නැවත පියවා ගැනීමට ක්‍රියාපටිපාටීන් පැනවීම හා අවශ්‍ය පියවර ගැනීම

9.4.04 එමෙන්ම බැංකුවෙහි ඉල්ලීම මත, බිල් පත් ඉදිරිපත් කල අවස්ථාවේදී ඒ පිලිබඳ නිසි ලෙස කටයුතු නොකළ හෝ බැංකුව වෙත නිසි පරිදි මුදල් ගෙවීම් සිදු නොකළ අවස්ථා සම්බන්ධයෙන් ඕනෑම ලේඛනයකට එරෙහිව සිදුකරනු ලැබූ අත්තිකාරම් ගෙවීම් ගනුදෙනුකරු විසින් බැංකුව වෙත පියවනු ඇත.

**9.5 එකතුකිරීම්**

9.5.01 බැංකුව විසින් ගෙවීම් එකතු කිරීමට ඉල්ලුම් කල හොත්, අදාළ බිල්පත, අණකරය හෝ ලේඛනය සඳහා වන සම්පූර්ණ ගෙවීම බැංකුව විසින් එකතු කිරීම් සහ බැංකුව වෙත ලැබීම මත පදනම්ව හා කොන්දේසි වලට යටත්ව සේවාවන් සැපයීමට බැංකුවට බලය පවතී.

9.5.02 බැංකුව විසින් එවැනි එකතු කිරීමක් හෝ බැංකුව වෙත ලැබීමක් නොමැති අවස්ථාවකදී, එවැනි සේවාවක් හා සම්බන්ධව ඇති ඕනෑම හිඟ මුදලක් බැංකුවෙහි ඉල්ලම මත ගනුදෙනුකරු විසින් බැංකුව වෙත පියවනු ඇත.

9.5.03 සෑම එකතු කිරීමක්ම, කලින් කලට බල පවත්වනු ලබන ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයෙහි එකතු කිරීම සඳහා වන නීතීන්ට යටත් වනු ඇත.

**9.6 ආරක්ෂාව**

9.6.01 පහසුකම් පිලිබඳ සැලකීමේදී, ආරක්ෂාව උදෙසා සියලුම ආරක්ෂිත මුදල් ගෙවනු ලබන තෙක් හෝ නිදහස් කරන තෙක් බැංකුව වෙත ලේඛන සහ භාණ්ඩ වෙනුවෙන් උකසක් හෝ ඇපයක් තැබිය යුතුය.

9.6.02 බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන වෙනත් සුරැකුම් පැවතුනද ඒවායේ බලපෑමට හෝ බලාත්මක වීමට යටත් නොවී, ඊට අමතරව මෙම ඇපය අඛණ්ඩ සුරැකුමක් විය යුතුව. සුරැකුම්පත් ඒකාබද්ධ කිරීමේ අයිතිය පිලිබඳ ඕනෑම සීමා කිරීමක් ඇපයට අදාළ නොවේ.

9.6.03 (i)ඕනෑම ලේඛනයක් පිළිගැනීම හෝ ගෙවීම පැහර හැරීමක් ඇත්නම් හෝ (ii) හිඟ මුදල් ගෙවිය යුතු දිනය වන විට සුරැකුම් මුදල් ගෙවීමට පාරිභෝගිකයා අසමත් වුවහොත් හෝ මෙම ගිවිසුමෙහි හෝ භාණ්ඩ හා සම්බන්ධ විශ්වාස්‍ය ලදුපතෙහි සඳහන් ඕනෑම කොන්දේසියක් යටතේ පැහැර හැර ඇත්නම් හෝ (iii) ගනුදෙනුකරු හෝ ඕනෑම අණ ලද්දෙකු හෝ ලේඛනයක ප්‍රතිග්‍රාහකයෙකු හට ණය මුදල් හිඟ බවට පත් වූ විට හෝ යම් කාර්යපටිපාටියකට යටත්ව එය ගෙවීමට නොහැකි නම් හෝ ගෙවීමට අපොහොසත් වීම පිළිගනී නම් හෝ බුන්වත්භාවය , වස්තුභංගත්වය, අවසන් වීම යනාදියට සමාන යමක් හෝ නෛතික ක්‍රියාවලිය එහි ඕනෑම වත්කමකට එරෙහිව පනවනු ලබයි නම් හෝ බලාත්මක කරන ලද නම් හෝ (iv) ලේඛන සහ/භාණ්ඩ වලට එරෙහිව බැංකුව සතු වන අයිතිවාසිකම් සහ සබඳතාවට

බලපෑමක් ඇති කරවීමේ හැකියාව ඇති ක්‍රියාමාර්ගයක් හෝ තර්ජනය කිරීමක් සිදු වුවහොත් හෝ (v) භාණ්ඩ අලෙවිකිරීමට සුදුසු යැයි බැංකුව සලකයි නම්,

ඕනෑම අවස්ථාවකදී යෝග්‍ය යැයි සලකනු ලබන ඕනෑම අයුරකින්, කිසිඳු සීමාවකින් හෝ හිමිකමකින් තොරව ඉල්ලීමක්, දැනුම්දීමක් නෛතික ක්‍රියාපටිපාටියක් හෝ ගනුදෙනුකරු හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් ඇති වෙනත් ඕනෑම ක්‍රියාමාර්ගයකින් තොරව සාක්ෂාත් කර ගැනීමක්, විකිණීමක්, සාකච්ඡා කිරීමක් හෝ වෙනත් අයුරකින් සියලුම හෝ යම් ලේඛන සහ භාණ්ඩ ඉවත් කිරීමෙන් ඇපය බලාත්මක කිරීමට අයිතිය ඇති අතර එවැනි  සාක්ෂාත් කර ගැනීමක්, විකිණීමක්, සාකච්ඡා කිරීමක් හෝ වෙනත් අයුරකින් සියලුම හෝ ඉවත් කිරීමක් කෙරෙහි බැංකුව විසින් වග කියනු නොලැබේ.

9.6.04 ගනුදෙනුකරු විසින් නොපියවූ භාණ්ඩ විකුණුම් ලෙස පවතින ඕනෑම අයිතියක් මෙමගින් බැංකුව වෙත පැවරේ.

9.6.05 මෙම ගිවිසුම යටතේ නිර්මාණය කර ඇති ඕනෑම හෝ සියලුම ඇපකර/ලියම/උකස් වලට යටත්ව පවතින ණය, සියලුම සුරැකුම් මුදල් පියවා අවසන් වන තුරු හෝ නිදහස් කරන තුරු සුරැකුම් මුදල් ලෙස පවතිනු ඇත.

9.7 ඇපකර හෝ උකස යටතේ පවතින ලේඛන හෝ භාණ්ඩ නිදහස් කිරීම

ලේඛන හෝ භාණ්ඩ පාරිභෝගිකයා වෙත හෝ ඔහුගේ නියමය යටතේ වෙනත් අයෙකුට නිදහස් කලේ නම්, ඒවා විශේෂයෙන්ම විකිණීම හෝ වෙළඳපොළ වටිනාකම අනුව සාමාන්‍ය වෙළඳ කොන්දේසි මත බැංකුව විසින් අනුමත කරනු ලබන වෙනත් කරුණක් අරමුණු කර ගනිමින් පාරිභෝගිකයා විසින් ඔවුන් සන්තකයේ තබා ගත යුතු අතර එවැනි අවස්ථාවකදී (භාර දෙනු ලබන අවස්ථාවේදී  විශ්වසා ලදුපත අත්සන් කලද නොකලද), එම ලේඛන, භාණ්ඩ සහ මුදල් උත්පාදන බැංකුවෙහි සහ එහි නියෝගයන් සඳහා පමණක් විශ්වාසය මත පැවතිය යුතුය. එවැනි සියලුම මුදල් උත්පාදන වෙනම පැවතිය යුතු අතර ඒවා ලැබුණු වහාම බැංකුව වෙත පියවිය යුතුය. එමෙන්ම ඕනෑම පුද්ගලයෙකුගෙන් එවැනි මුදල් උත්පාදන ඉල්ලුම් කිරීමට සහ/හෝ ලබා ගැනීමට බලය බැංකුව සතු වේ.

**9.8 ප්‍රතිඥාවන්**

9.8.01

a) බැංකුව යටතේ පවතින ඇපකර සඳහා හැර, වෙනත් ලේඛන සහ භාණ්ඩ, අවහිරතා සහ හිමිකාරිත්වයන්ගෙන් නිදහස්ව පාරිභෝගිකයාගේ තනි ප්‍රතිලාභී හිමිකම යටතේ පවතිනු ඇති බවට;

b) බැංකුවට අවශ්‍ය වනු ඇති ආකාරයට සියලුම රක්ෂිත අවදානම් වලට එරෙහිව භාණ්ඩ වල සම්පූර්ණ වටිනාකමට අනුව රක්ෂණය කරනු ඇති අතර බැංකුව විසින් ඉල්ලුම් කළහොත් අදාළ ප්‍රතිපත්තීන් මගින් අනුමත කිරීමට ඇති භාණ්ඩ සඳහා බැංකුවට අවශ්‍ය පරිදි සකස් කරනු ඇත. එමෙන්ම හානි හෝ අලාභයන් සඳහා වන ගෙවීම්, ඍජුව බැංකුව වෙත සිදු කිරීමට රක්ෂණකරු යොමු කරනු ඇති බවට;

c) භාණ්ඩ හා පියවීමට ඇති මුදල් හා සම්බන්ධ සියලුම රක්ෂණ ක්‍රියාවන්ට අදාළ ගෙවීම් බැංකුව වෙත සිදු කරනු ඇති අතර බැංකුවෙහි විශ්වාසය මත එවැනි ක්‍රියාවන් අත්හිටුවනු ඇති බවට;

d) බැංකුවෙහි නමින් ලේඛන පවතිනු ඇති අතර එම ලේඛන බැංකුව වෙත හෝ බැංකුවෙහි නියෝගයන් පරිදි බැර කර ලේඛන සහ  භාණ්ඩයන්හි බැංකුවෙහි අභිමතය පරිදි වාර්තාවන්හි සටහන් කරනු ඇති බවට;

e) භාණ්ඩ ප්‍රවාහනය සහ ගබඩා කිරීම සඳහා වන පිරිවැය සම්පූර්ණ සහ ආනුෂංගික වශයෙන් ගෙවනු ඇති බවට;

f) භාණ්ඩ මිලදී ගැනීම සම්පූර්ණ කිරීම සඳහා ගැනුම්කරුට ඇති හැකියාවට අහිතකර බලපෑමක් ඇති කරවිය හැකි ඕනෑම අවස්ථාවක් පිලිබඳ දැනගත් විගස එය බැංකුව වෙත දැනුම් දෙන බවට;

g) ලේඛන සහ / හෝ භාණ්ඩ සම්බන්ධයෙන් බැංකුව විසින් ලබා දී ඇති ඕනෑම ඇපයක්, වන්දි පූරණයක් හෝ වෙනත් වගකීමක් වෙතින් බැංකුව කඩිනමින් නිදහස් කර ගැනීමට කටයුතු කරන බවට;

h) බැංකුව විසින් නියම කරන ලද ආකාරයට හෝ බැංකුවෙහි පූර්ව ලිඛිත අවසරයක් සහිතව ලේඛන සහ/හෝ භාණ්ඩ සමග කටයුතු කිරීමේදී ඒවා මාරු කිරීම, හුවමාරු කිරීම, විකිණීම, බැහැර කිරීම හෝ වෙනත් අයුරක කටයුත්තක් සිදු කිරීම හෝ කිරීමට උත්සාහ දැරීම නොකරන බවට;

i) පාරිභෝගිකයා හෝ වෙනත් පුද්ගලයෙකු සතු දේපල සමග වෙන්ව මෙම භාණ්ඩ තැබිය යුතු බවට;

j) බැංකුවෙහි පූර්ව ලිඛිත අවසරයකින් තොරව භාණ්ඩ සකස් කිරීම හෝ වෙනස් කිරීමට අවසර ලබා නොදෙන බවට සහ

k) භාණ්ඩයන්හි වටිනාකමට සහ / හෝ ඇපයෙහි හා මෙම ගිවිසුමෙහි කාර්යසාධකතාවයට හානි වන ආකාරයේ කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගන්නා බවට ගනුදෙනු කරු විසින් පොරොන්දු වේ.

9.8.02 බැංකුවෙහි ඉල්ලීම මත,

a) බැංකුවට අවශ්‍ය පරිදි, ලේඛන සහ භාණ්ඩ පිලිබඳ සහ ඕනෑම යෝජිත භාණ්ඩ විකිණීමක් පිලිබඳ තොරතුරු බැංකුව වෙත ලබා දෙන බවට
b) භාණ්ඩ පිලිබඳ තොරතුරු සහ භාණ්ඩහි තත්වය, ගුණාත්මකභාවය හෝ ප්‍රමාණයෙහි සිදුවන ඕනෑම වෙනස් වීමක් පිලිබඳ බැංකුව වෙත දැනුම් දෙන බවට සහ
c) මෙම ගිවිසුම යටතේ බැංකුව සතු බලතල හා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපකාරී වන බවට බැංකුව විසින් සලකනු ලබන ලේඛන ක්‍රියාත්මක කරන බවට සහ පනත් ක්‍රියාවට නංවන බවට පාරිභෝගිකයා විසින් පොරොන්දු වේ.

**9.9** බලය පැවරීම

පහත කරුණු සඳහා පාරිභෝගිකයා විසින් බැංකුව වෙත බලය පැවරේ.

a) ලබා දී ඇති පහසුකම හා සම්බන්ධව ඔහුගේ අනුරූපකයෙකු, නාමිකයෙකු හෝ නියෝජිතයෙකු ලෙස වෙනත් ඕනෑම පුද්ගලයෙකු පත් කිරීමට සහ මම ගිවිසුම යටතේ පාරිභෝගිකයා සතුව වන ඕනෑම බලතලයක් එම පුද්ගලයා වෙත පැවරීමට.
b) මෙම ගිවිසුම යටතේ සිය වගකීම් වලට අනුකූලව කටයුතු කිරීමට පාරිභෝගිකයා විසින් පහර හැරීම වලක්වා ගැනීමට, අවශ්‍ය යැයි සලකනු ලබන යම් ගෙවීමක් පාරිභෝගිකයාගේ පිරිවැය යටතේ සිදු කිරීමට පියවර ගැනීමට.
c) භාණ්ඩ මෙරටට ගෙන්වා ගැනීමට සහ ගබඩා කිරීමට හා ඒවා නැව්ගත කිරීම සඳහා සූදානම් කිරීමට සහ ඕනෑම අවස්ථාවකදී එම භාණ්ඩ පරික්ෂාවට ලක් කිරීමට
d) ලේඛන සහ භාණ්ඩ සමග ඇති පාරිභෝගිකයා හට ඇති බැඳියාව වෙනත් ඕනෑම පුද්ගලයෙකු හට දැනුම් දීමට.
e) ඕනෑම ලේඛබද්ද ණයවරයක්, ඇපකරුවකු, වන්දි පූරණයක් හෝ බැංකුව විසින් ලේඛන සහ / හෝ භාණ්ඩ යටතේ ලබා දී ඇති වෙනත් වගකීමක් යටතේ මුදල් හිඟ අවස්ථාවකදී හෝ ඉල්ලුමක් ඇති අවස්ථාවකදී පාරිභෝගිකයාගේ හෝ වෙනත් පුද්ගලයෙකුගේ සඳහනක් හෝ තවදුරටත් බලය පැවරීමකින් තොරව, ලේඛන, හිමිකම් හෝ ඉල්ලුම ආදියෙහි (ගනුදෙනුකරු විසි ගෙන එන මතභේද පිලිබඳ නොතකා) වලංගුභාවය හෝ වෙනත් කරුණු පිලිබඳ පරීක්ෂාවකින්

තොරව අදාළ ගෙවීම් වහාම සිදු කිරීමට සහ බැංකුව විසින් සිදු කරනු ලබන ගෙවීම ගනුදෙනුකරු සමග බැඳී පවතින බවට.

**9.10 වගකීම් සහ වන්දිපූරණය සඳහා සීමාව**

9.10.01 බැංකුවෙහි, එහි නිලධාරීන්ගේ හෝ සේවකයින්ගේ නොසැලකිලිමත්භාවය හෝ හිතාමතා පැහැරහැරීම හේතුකොටගෙන හැරුණුවිට, ලේඛන හෝ භාණ්ඩ හා සම්බන්ධව හෝ වෙනත් අයුරකින් එම භාණ්ඩ වල තත්වය, ප්‍රමාණය හෝ වටිනාකම සඳහා බැංකුව හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු වෙනුවෙන් ක්‍රියා කිරීම, ප්‍රමාද වීම හෝ ක්‍රියා කිරීමට අසමත් වීම පිළිබඳ පාරිභෝගිකයා හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු වෙත බැංකුව විසින් වගකියනු නොලැබේ.

9.10.02 බැංකුවෙහි, එහි නිලධාරීන්ගේ හෝ සේවකයින්ගේ නොසැලකිලිමත්භාවය හෝ හිතාමතා පැහැරහැරීම හේතුකොටගෙන හැරුණුවිට, ඕනෑම පාරිභෝගිකයකු යටතේ සහ ඔවුන් විසින් හා ඔවුන්ට විරුද්ධව ගෙන එනු ලබන සියලුම ක්‍රියාවන් හා ක්‍රියා පටිපාටින් නිසාවෙන් ලේඛන සහ/හෝ භාණ්ඩ හා සම්බන්ධව සහ මෙම ගිවිසුම යටතේ බැංකුව සතු බලතල හා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධව පාරිභෝගිකයා විසින් ඕනෑම ආකාරයක වගකීම්, අයිතීන්, පිරිවැය හා හානි වලට එරෙහිව බැංකුව, එහි නිලධාරීන් සහ සේවකයින් වෙත වගකිව යුතුය.

**9.11 පාරිභෝගික උපදෙස්**

9.11.01 පහසුකම්, ලේඛන සහ භාණ්ඩ සැලකිල්ලට ගනිමින් බලයලත් පුද්ගලයාගේ (පුද්ගලයින්ගේ) උපදෙස් පරිදි ක්‍රියා කිරීමට බැංකුවට බලය හිමි වේ.

9.11.02 බැංකුව විසින් සිය අභිමතය පරිදි බලයලත් පුද්ගලයා (පුද්ගලයින්) විසින් ලබා දුන් බවට විශ්වාස කරන උපදෙස් පිළිගනු ඇති අතර එවැනි උපදෙස් මත සද්භාවයෙන් ක්‍රියා කරයි නම්, එම උපදෙස් බලයලත් පුද්ගලයා (පුද්ගලයින්) විසින් ලබා නොදුන්නද, එම උපදෙස් ලබා දෙනු ලබන පුද්ගලයා (පුද්ගලයින්)ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමේ වගකීමක් බැංකුව සතු නොපවතී. එවැනි උපදෙස් පාරිභෝගිකයා සමග බැඳී පවතින අතර එසේ ක්‍රියා කිරීම පිළිබඳ බැංකුව විසින් කිසිඳු වගකීමක් ගනු නොලැබේ.

**9.12 ගෙවීම්**

9.12.01 සම්පූර්ණ ආරක්ෂිත මුදල හෝ ඉන් කොටසක් බැංකුව විසින් බැංකුව සමග පවතින ඕනෑම ගිණුමක් වෙත හර කරනු ඇත.

9.12.02 පාරිභෝගිකයා විසින් සිදු කරනු ලබන ගෙවීම්, පාරිභෝගිකයාහට යම් රඳවා ගැනීමක් සඳහා නීතියෙන් බල කරන අවස්ථාවකදී බැංකුව වෙත සත්‍ය වශයෙන්ම ලැබුණු මුදල, රඳවා ගැනීමක් නොමැති අවස්ථාවකදී ලැබීමට තිබූ මුදලට සමාන වන බැවින්, ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු මුදල වැඩිවනු ඇති අතර එවැනි අවස්ථාවකදී හැර කිසිදු හිලව් කිරීමක්, පිළියැදුමක්, රඳවා ගැනීමක් හෝ ඕනෑම ආකාරයක කොන්දේසියකින් තොරව බැංකුව විසින් නියම කර ඇති ආකාරයට බැංකුව වෙත සිදු කල යුතුය.

9.12.03 පාරිභෝගිකයා විසින් බැංකුව වෙත සිදු කරනු ලබන ගෙවීම්, ඊට අදාළ වගකීමට සම්බන්ධ මුදල් ඒකකයෙන් විය යුතු අතර බැංකුවෙහි ලිඛිත එකඟතාවය මත වෙනත් මුදල් වර්ගයකින්  ගෙවනු ලබන්නේ නම්, එම මුදල් පරිවර්තනය කිරීමේ විනිමය අනුපාතිකය මත පදනම්ව ගෙවීම් සිදු කල යුතුය.

9.12.04 මෙම ගිවිසුමට අනුව, කිසිඳු ගෙවීමක් කිසිඳු තීන්දුවකට, උසාවි නියෝගයකට හෝ වෙනත් එවැන්නකට අනුගත නොවන අතර සියලුම ගෙවීම් මෙම ගිවිසුමට යටතේ අදාළ ගෙවීම සිදු කල යුතු මුදල් ඒකකයෙන් සහ වෙනත් මුදල් ඒකකයකින් පියවන්නේ නම් අදාළ මුදල් ඒකකය වෙත සැබෑ විනිමය අනුපාතයට අනුව පරිවර්තනය වී මුළු මුදල් ප්‍රමාණය බැංකුව වෙත ලැබී අවසන් වූ විට සහ එසේ වූවොත් පමණක් පාරිභෝගිකයා විසින් සිදු කරන ලද ගෙවීම් හා සම්බන්ධව ඇති බැඳීම නිදහස් කරනු ඇත. සිදු කරන ලද ගෙවීම්, එම මුදල් ඒකකය මගින් ප්‍රකාශිත වගකීමෙහි වටිනාකමට ප්‍රමාණවත් නොවුනහොත්, එම හිඟ මුදල සඳහා පාරිභෝගිකයා විසින් වගකිව යුතුය.

9.12.05 සුරැකුම් මුදල් වෙනුවෙන් බැංකුව වෙත ගෙවනු ලැබූ ඕනෑම මුදලක්, එම සුරැකුම් මුදල සඳහා හෝ ඒ වෙනුවෙන් අදාළ වීමක්  හෝ බැංකුවෙහි අභිමතය පරිදි සියලු ආරක්ෂිත මුදල් සඳහා ඔප්පු කිරීමට ඇති අයිතිය ආරක්ෂා කර ගැනීමේ දැක්ම සහිතව යම් ගිණුමක් වෙත බැර වනු ඇත.

9.12.06 සුරැකුම් මුදල් වෙනුවෙන් බැංකුව වෙත ගෙවනු ලැබූ ඕනෑම මුදලක්, බුන්වත්භාවයට, වස්තුභංගත්වයට හෝ අවසන් කිරීමකට අදාළ ඕනෑම නීතියක් හෝ වෙනත් ඕනෑම හේතුවක් මත

ආපසු ගෙවීමට අවශ්‍ය වුවහොත්, එම මුදල් නොගෙවා ඇති ලෙස සලකා මෙම ගිවිසුමෙහි බලය ක්‍රියාත්මක කිරීමට බැංකුවට හැකියාව පවතී.

**9.13 හිලව් කිරීම**

ඕනෑම අවස්ථාවකදී බැංකුව විසින් කිසිඳු දැනුම්දීමකින් තොරව සුරැකුම් මුදල සඳහා හෝ ඒ වෙනුවෙන් බැංකුව හෝ වෙනත් පාර්ශවයක් සමග පාරිභෝගිකයාගේ නමින් පවතින හෝ එසේ නොවන ඕනෑම ගිණුමක් සඳහා ගනුදෙනුකරුට හිමි වන ඕනෑම බැර ශේෂයක් යෙදවීම සහ/හෝ බැංකුව විසින් ගනුදෙනුකරු වෙත ගෙවිය යුතු වෙනත් වගකීමක් හිලව් කිරීම සිදු කල හැක. මෙම කර්තව්‍ය සඳහා, මෙම ඉල්ලුම ක්‍රියාවට නැංවීම වෙනුවෙන් අදාළ ගිණුමට බැර වී ඇති මුදල් යෙදවීමේදී, වෙනත් මුදල් ඒකකයන් සඳහා අවශ්‍ය වන ආකාරයට අදාළ විනිමය අනුපාතිකයන්ට අනුව මිලදී ගැනීමට බැංකුවට බලය හිමි වේ. එවනි හිලව් කිරීමක් වෙනුවෙන් බැංකුවෙහි අනෙකුත් ඕනෑම වගකීමක් විනිමය අනුපාතයට අනුව සුරැකුම් මුදල් හා අදාළ මුදල් ඒකකය වෙත ඒ හා සමානව පරිවර්තනය කරනු ඇත. එවැනි හිලව් කිරීමක් සඳහා බැංකුවෙහි වෙනත් ඕනෑම වගකීමක්, සුරැකුම් මුදල් සඳහා අදාළ මුදල් ඒකකය වෙත ඒ හා සමාන අකාරයෙන් පරිවර්තනය වනු ඇත.

**9.14 පාරිභෝගිකයාගේ ගිණුම්**

බැංකුව විසින් ඕනෑම අවස්ථාවකදී පාරිභෝගිකයාගේ නමින් දැනට පවතින ගිණුමක් පවත්වාගෙන යාම සහ නව ගිණුමක් ආරම්භ කිරීම සිදු කරනු ඇති අතර එවැනි ගිණුම් සඳහා පසු කාලින ගනුදෙනු, ආදායම් හෝ ගෙවීම්, පහත දක්වා ඇති පාරිභෝගිකයාගේ වගකීම් සමග සම්බන්ධ නොවනු ඇත.

**9.16 අයිතිවාසිකම් අත්නොහැරීම**

මෙම ගිවිසුමට අනුව බැංකුව මගින් සිදු කරන හෝ පහර හරිනු ලබන කිසිවක් පහත දක්වා ඇති අයිතීන්, බලයක් සහ පිළියම් සඳහා හෝ තවදුරටත් පවතින එවන් කරුණු හෝ එවැනි අයිතීන්, බලයක් සහ පිළියම් ක්‍රියාත්මක කිරීම සඳහා බල නොපානු ඇත.

**9.17 සන්නිවේදනය**

මෙම ගිවිසුම යටතේ ලබා දෙන ඕනෑම දැන්වීමක්, ඉල්ලීමක්, හෝ වෙනත් සන්නිවේදනයක් ලිඛිතව පාරිභෝගිකයාගේ නමින් බැංකුව සමග අවසාන වරට ලියාපදිංචි කරන ලද ලිපිනය වෙත මෙම

කරුණ සම්බන්ධයෙන් පාරිභෝගිකයාට මෙම ලිපිනය හරහා කටයුතු කල හැකි බව දන්වමින් උපලේඛනයේ දක්වා ඇති කාර්යාලීය බැංකු ලිපිනයට හෝ වෙනත් එවැනි ලිපිනයක් වෙත යොමු කර පුද්ගලිකව බෙදාහැරීම මගින්, අදාල ලිපිනයට ලබා දීම මගින්, තැපැල මගින්, ෆැක්ස් මාර්ගයෙන් හෝ ටෙලෙක්ස් පණිවිඩයක් මගින් යොමුකල යුතු අතර පුද්ගලිකව බෙදාහරිනු ලබන අවස්ථාවකදී හෝ අදාල ලිපිනයට ලබා දුන් අවස්ථාවකදී ගනුදෙනුකරු වෙත එම අවස්ථාවේදීම අදාළ පණිවිඩය ලබා දුන් බවටත් තැපැල මගින් යවනු ලැබූ අවස්ථාවකදී තැපැල් කරනු ලැබූ දිනට දින දෙකකට පසුව සහ ෆැක්ස් මගින් හෝ ටෙලෙක්ස් පණිවිඩයක් මගින් යවනු ලැබූ අවස්ථාවකදී පන්නිවිදය යවනු ලැබූ දිනය තුලදීම එය ගනුදෙනුකරු වෙත ලැබුණු බවටත් බැංකුව වෙත යම් සන්නිවේදනයක් සත්‍ය වශයෙන් ලැබුණු දිනය ඊට අදාළ දිනය ලෙසත් සලකනු ඇත.

**9.18** **විභේද්‍යභාවය**

මෙම ගිවිසුමෙහි සෑම විධිවිධානයක්ම සෙසු විධිවිධානයන්ගෙන් වෙන්ව හා වෙනස්ව පවතින අතර එම විධවිධානයන්ගෙන් එකක් හෝ කිහිපයක් හෝ නීතිවිරෝධී, අවලංගු හෝ බලාත්මක කල නොහැකි තත්වයට පත් වුව හොත් ඊට අමතරව පවතින කිසිඳු විධිවිධානයක් එමගින් බලපෑමට ලක් නොවේ.

**9.19** **නිතිය සමග ඇති අනුකූලතා සහ මූල්‍ය අපරාධ අනුකූලතා**

9.19.1 බැංකුව ක්‍රියාත්මක වන අධිකරණ බලය යටතේ පවතින (අදාළ මුදල් විශුද්ධිකරණ, අල්ලස් හා දූෂණ හා සම්බන්ධ නීති හා රෙගුලාසි ඇතුළු) වැනි නීති රීති වලට අනුකූල වීමට බැංකුව බැඳී සිටී.

9.19.2 නීතියට අනුකූල වීම සඳහා බැංකුවට ඇති හැකියාව බැංකු ගනුදෙනුකරුවන්ගේ හැසිරීම සමග සෘජුවම සම්බන්ධ වන බැවින් ගනුදෙනුකරුවන්ද එම නීති වලට අනුකූලව කටයුතු කල යුතු අතර ගනුදෙනුකරුවන් හෝ බැංකුව විසින් එම නීති උල්ලංඝනය කල බවට පත් නොවන ආකාරයෙන් තම ව්‍යාපාරයන් පවත්වාගෙන යා යුතුය.

9.19.3 කිසියම් නීති උල්ලංඝනය කිරීමක් හෝ ගනුදෙනුකරුවන් වෙත බැංකුව විසින් භාණ්ඩ හා සේවාවන් සැපයීම හා සම්බන්ධ හෝ මෙම ප්‍රකාශයෙහි දක්වා ඇති කරුණු හා සම්බන්ධ ඕනෑම අදාළ නීතියක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරුට හෝ එහි අනුබද්ධිතයන්ට එරෙහිව ගෙන එනු ලබන ඕනෑම ක්‍රියාවක්, පරීක්ෂණයක් හෝ ක්‍රියා පටිපාටියක් පිලිබඳ ගනුදෙනුකරු විසින් දැනගත

හොත් ගනුදෙනුකරු විසින් වහාම ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතුය. (එසේ කිරීමට නීතිය මගින් තහනම් කර නොමැති නම්)

**9.20 සම්බාධක**

9.20.1 සිය ව්‍යාපාරයට අදාළ වන සම්බාධක නීති වෙත අනුකූල වීමට බැංකුව බැඳී සිටි. ("සම්බාධක") ඕනෑම සම්බාධක උල්ලංඝනය කිරීමක් බැංකුවෙහි කීර්ති නාමය, අධිකාරීන්, නියාමන සබඳතා වෙත බරපතල බලපෑමක් ඇති කරනු ඇති අතර භාණ්ඩ හා සේවාවන් සැපයීමට බැංකුව සතු හැකියාවට සහ බැංකු ගනුදෙනුකරුවන් සමග ගනුදෙනු වෙත පිවිසීමට බාධා ඇති කරනු ඇත.

9.20.2 සම්බාධකයන්ට අනුකූලව කටයුතු කිරීමට බැංකුව සතු වන හැකියාව එහි ගනුදෙනුකරුවන්ගේ හැසිරීම සමග ඍජුව සම්බන්ධ වන බැවින්, පාරිභෝගිකයා විසින් පහත කරුණු සනාථ කර තහවුරු කල යුතුය. (i) පාරිභෝගිකයා සහ එහි අනුබද්ධිතයන්, සම්බාධක සඳහා ඉලක්ක හෝ විෂය නොවන අතර (ii) බැංකු සාමාජිකයෙකු සහභාගී වන කිසිදු භාණ්ඩයක්, සේවාවක් හෝ ගනුදෙනුවක් (හෝ ඒවායේ කටයුතු) සඳහා සම්බාධකයන්හි ඉලක්ක හෝ විෂය වන ඕනෑම පුද්ගලයෙකුගේ ප්‍රයෝජනය සඳහා යොදාගෙන හෝ යොදාගනු ඇති ලබන හෝ ඕනෑම ආකාරයකින් පාරිභෝගිකයා සහ එහි අනුබද්ධිතයන් හෝ ඕනෑම බැංකු සාමාජිකයෙකු විසින් ඕනෑම සම්බාධක කඩ කිරීමක ප්‍රතිඵලයක් බවට පත් වන හෝ සම්බාධකයන්හි ඉලක්ක හෝ විෂය බවට පත් වන බවට. බැංකුව විසින් බැංකුවෙහි සම්බාධක ප්‍රතිපත්තීන් උල්ලංඝනය වීමට හේතු වේ නම්, ඕනෑම නිෂ්පාදනයක් හෝ සේවාවක් ලබා නොදීමට හෝ ගනුදෙනුවක් ක්‍රියාවට නැංවීම වැලක්වීමට බැංකුව වෙත අයිතිය හිමි වේ.

## 10. කාගිල්ස් බැංකුව වෙත අධිකාරි බලය

ගිණුමෙහි(ගිණුම් වල) බැංකු ගනුදෙනු වෙත ප්‍රවේශ වීම කාගිල්ස් බැංකුව විසින් ආයතනික අන්තර්ජාල බැංකුකරණය මගින් අවසර දෙනු ලබන්නේ ආයතනික අන්තර්ජාල බැංකුකරණ පරිශීලක හැඳුනුම සහ පාරිභෝගික මුරපදය ඇතුළු ඕනෑම ආකාරයකින් පරිශීලකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසුවය. පාරිභෝගිකයා විසින් ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමට ඔහු විසින් කාගිල්ස් බැංකුව වෙත සීඝ්‍ර බලය පැවරීමක් සිදු කරනු ඇත. ආයතනික අන්තර්ජාල බැංකුකරණ පරිශීලක හැඳුනුම සහ පාරිභෝගික මුරපදය තහවුරු කර ගැනීම මගින් හැර ඕනෑම ගනුදෙනුවක / ලැබුණු උපදෙස් වල හෝ පරිශිලකයාගෙන් සහ / හෝ පාරිභෝගිකයාගෙන් ආයතනික අන්තර්ජාල බැංකුකරණය හරහා ලැබුණු බවට අදහස් කරන හෝ පරිශිලකයාගෙන් සහ / හෝ පාරිභෝගිකයාගෙන් ආයතනික අන්තර්ජාල බැංකුකරණය

හරහා යවනු ලැබූ බවට අදහස් කරන උපදෙස් වල සත්‍යතාවය තහවුරු කර ගැනීමට කාගිල්ස් බැංකුවට වගකීමක් නොමැත.

ආයතනික අන්තර්ජාල බැංකුකරණ කටයුතු ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවේදී පරිශීලකය විසින් ලබා දෙනු ලබන මුද්‍රිත ප්‍රතිදානයන් අන්තර්ජාල ප්‍රවේශය මෙහෙයවීම පිලිබඳ වාර්තාවක් වන අතර කාගිල්ස් බැංකුවෙහි සාපේක්ෂ ගනුදෙනු පිලිබඳ වාර්තාවක් නොවිය යුතුය. කාගිල්ස් බැකුව විසින් පරිගණක පද්ධතියක පවත්වාගෙන යනු ලබන බැංකුවෙහි වාර්තා හෝ වෙනත් වාර්තාවන් සියලුම අරමුණු සඳහා තීරණාත්මක සහ බැඳී පවතින බවට පිළිගත යුතුය.

## 11. තොරතුරු වල නිරවද්‍යභාවය

කාගිල්ස් බැංකුව වෙත ආයතනික අන්තර්ජාල බැංකුකරණය හරහා හෝ විද්‍යුත් තැපැල හෝ ලිඛිත සන්නිවේදනය වැනි වෙනත් ඕනෑම මාර්ගයකින් ලබා දුන් තොරතුරු වල නිරවද්‍යභාවය පිලිබඳ සේවාදායකයා වගකිව යුතුය. පාරිභෝගිකයා හෝ පරිශීලකයා මගින් ව්‍යාජ තොරතුරු ලබා දීම මගින් ඇති වන ප්‍රතිවිපාකයන් කෙරෙහි කාගිල්ස් බැංකුව කිසිදු වගකීමක් දරනු නොලැබේ.

කාගිල්ස් බැංකුව වෙත ලබා දෙනු ලැබූ තොරතුරු වල දෝෂයක් ඇති බවට පාරිභෝගිකයාහට සැක සහිත නම්, හැකි ඉක්මනින් කාගිල්ස් බැංකුව වෙත ඒ පිලිබඳ දැනුම් දිය යුතුය. කාගිල්ස් බැංකුව විසින් වඩාත් සුදුසුම ආකාරයට හැකි ඉක්මනින් එම දෝෂය නිවැරදි කිරීමට උත්සාහ කරනු ඇත.

## 12. ව්‍යවස්ථාපිත නීතිය සහ අධිකරණ බලය

මෙම කොන්දේසි හා නියමයන්හි දක්වා ඇති විධිවිධානයන් ශ්‍රී ලංකාව තුල පවතින නීතිය මගින් පාලනය වන අතර එම නීතියට අනුකූල වේ.

12.1 අන්තර්ජාල හරහා ලබා දෙනු ලබන සේවාවන් හෝ මෙම කොන්දේසි හා නියමයන් උල්ලංඝනය කිරීමක්, අවසන් කිරීමක් හෝ අවලංගු වීමක් නිසාවෙන් පැන නගින හෝ ඒ හා සම්බන්ධ ඕනෑම ආරවුලක්, මත භේදයක් හෝ හිමිකමක්, 1995 අංක 11 දරන ශ්‍රී ලංකා තීරකීකරණ පනතෙහි විධි විධානයන්ට අනුකූලව තීරකීකරණ කිරීම මගින් පියවිය යුතුය.

12.2 ගනුදෙනුකරු හා කාගිල් බැංකුව අතර හෝ ගනුදෙනුකරු හා අනුබද්ධිතයෙකු අතර යම් කරුණක් සම්බන්ධයෙන් මතුවන ගැටළු සම්බන්ධයෙන් මතභේදාත්මක අවස්ථාවකදී දෙපාර්ශවය (බැංකුව සහ පාරිභෝගිකයා) විසින් එක් එක් පාර්ශවයන් සඳහා තීරකයන් පත් කරනු ඇති අතර එසේ පත් කරන ලද තීරකයන් විසින් තෙවන තිරකයකු පත් කරනු ඇත.

12.3 තීරකීකරණය කරනු ලබන ස්ථානය කොළඹ වන අතර ඕනෑම තීරණය අවසන් තීරණය වන අතර දෙපාර්ශවයම සමග බැඳී පවතී.

12.4 තීරකීකරණය ක්‍රියාපටිපාටීන්, 1995 අංක 11 දරන තීරකීකරණ පනත යටතේ ඉංග්‍රීසි / ~~සිංහල / දෙමළ~~ මාධ්‍යයෙන් පැවැත්විය යුතු අතර ඕනෑම තීන්දුවක් හෝ තීන්දු ~~තෝරා ගත්~~ ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදනය කල යුතුය.

12.5 තීරක විසින් ලබා දෙනු ලබන තීන්දු අවසන් මෙන්ම තීරණාත්මක තීන්දුව වන අතර අදාළ පාර්ශවන් සමග බැඳී පවතිනවා මෙන්ම තීන්දුව බලාත්මක කිරීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පාර්ශවයන්ට අයිතිය ඇත.

**13. විදේශීය අධිකරණ බලය**

කාගිල්ස් බැංකු අන්තර්ජාල බැංකුකරණ සේවාව ශ්‍රී ලංකාව තුල පවතින නීතියට යටත් වේ. ශ්‍රී ලංකාව හැර වෙනත් රටක සිටින පුද්ගලයෙකුහට මෙම වෙබ් අඩවිය වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඇති වුවද එමගින් එම රටෙහි නීතීන්ට අනුව මෙම අන්තර්ජාලය හරහා ලබා දෙන සේවාවන් සහ ඒ හා සම්බන්ධ කිසිඳු කරුණක් පාලනය වන බව අදහස් නොවේ.

අන්තර්ජාලය හරහා ලබා දෙන සේවාවන්, විදේශීය පදිංචිකරුවන් සඳහා අදාළ නොවන අතර පූර්ව නියාමන අනුකූලතාවයකින් තොරව අන්තර්ජාලය හරහා ලබා දෙන එවැනි සේවාවන් ලබා දීමේ හැකියාව නොමැත. අන්තර්ජාලය හරහා ලබා දෙන සේවාවන් වෙත නීත්‍යානුකූලව ප්‍රවේශ විය හැකිද සහ / හෝ ඔවුන්ට අදාළ අධිකරණ බලය යටතේ භාවිතා කල හැකිද යන්න තහවුරු කර ගැනීම එම විදේශීය පදිංචිකරුවන්ගේ වගකීම වේ. අන්තර්ජාලය හරහා ලබා දෙන සේවාවන්, ඕනෑම පුද්ගලයෙකු හට, දීමනාවන් ලබා දීම හා ඒ සඳහා පෙළඹවීම නීති විරෝධී වන

ඕනෑම අධිකරණ බලයක් යටතේ අලෙවිය සඳහා ලබා දනු ලබන දීමනාවක් හෝ කිසියම් සේවාවක් මිලදී ගැනීම සඳහා ලබා දෙන දීමනාවක් වෙත පෙළඹවීමක් නොවේ.

## 14. රහස්‍යතා ප්‍රතිපත්තිය

මෙම වෙබ් අඩවිය භාවිතා කිරීමේ ක්‍රියාවලියේදී, කාගිල්ස් බැංකුව විසින් රහස්‍යභාවයක් සහිත තොරතුරු ද ඇතුලත්ව පාරිභෝගිකයා හා සම්බන්ධ තොරතුරු වෙත ප්‍රවේශ වනු ඇත. කාගිල්ස් බැංකුව සිය ගනුදෙනුකරුවන්ගේ පුද්ගලිකත්වය සුරැකීමට දැඩිව කැපවීමෙන් කටයුතු කරන අතර බැංකුව වෙත ලබා දුන් තොරතුරු ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත. කාගිල්ස් බැංකුව තොරතුරු සහ අන්තර්ජාලය හරහා එම තොරතුරු සම්ප්‍රේෂණය වීමේදී ඒවායේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගෙන ඇති අතර කාගිල්ස් බැංකු පාර්ශවය මගින් සිදුවන බරපතල නොසැලකිලිමත්භාවය නිසාවෙන් සිදු වූවක් හැරුනුකොට රහස්‍ය තොරතුරු අනාවරණය කිරීම වෙනුවෙන් බැංකුව වග කියනු නොලැබේ.

පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව හා සම්බන්ධ රහස්‍යභාවය සහිත, වෙබ් අඩවිය ඔස්සේ අන්තර්ජාලය හා සම්බන්ධ සේවාවන් ලබා ගැනීමේ ක්‍රියාවලියේදී ලබා ගන්න ලද කුමන ආකාරයක හෝ කිසිඳු තොරතුරක් වෙනත් ඕනෑම පුද්ගලයෙකු වෙත නිරාවරණය නොකළ යුතුය. මෙම වගකීම ඉටු කිරීමට අපොහොසත් වීම, මෙම ගිවිසුමෙහි කොන්දේසි හා නියමයන් බරපතල ලෙස උල්ලංඝනය කල බවට සලකනු ලබන අතර සේවාදායකයාට එරෙහිව ඇති විය හැකි ඕනෑම හානියක් සඳහා කිසිඳු බාධාවකින් තොරව අන්තර්ජාලය හා සම්බන්ධ සේවාවන් කාගිල්ස් බැංකුව විසින් ලබා දීම අවසන් කිරීමටත් හැකියාව ලැබෙනු ඇත.

පහත සඳහන් කරුණු වෙනුවෙන් සද්භාවයෙන් යුතුව ක්‍රියා කිරීමකදී හැර, පාරිභෝගිකයා විසින් ලබා දෙනු ලැබූ තොරතුරු කිසිඳු පුද්ගලයෙකු වෙත අනාවරණය නොකිරීමට කාගිල්ස් බැංකුව විසින් වගකියනු ලබයි.

I. නීත්‍යානුකූල අවශ්‍යතා සඳහා තහවුරු කිරීමට හෝ නෛතික ක්‍රියාවලියක් සඳහා අනුකූල වීමට ;
II. කාගිල්ස් බැංකුවෙහි දේපල හෝ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා රැක ගැනීමට ;
III. කොන්දේසි හා නියමයන් බලාත්මක කිරීමට ; හෝ

IV. කාගිල්ස් බැංකු සාමාජිකයින්ගේ හෝ වෙනත් අයගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කිරීමට

ගනුදෙනුකරු විසින් ඔහුගේ විස්තර සහ ගනුදෙනු ඉතිහාසය හා සම්බන්ධ සියලු තොරතුරු, නීත්‍යානුකූල හෝ සාම්ප්‍රදායික පිළිවෙත් වලට අනුව බැංකු / මූල්‍ය ආයතන / ණය කාර්යාංශ / ඒජන්සි / ඕනෑම විදුලි සංදේශන හෝ විද්‍යුත් නිශ්කාෂණ ජාලයක සහභාගිත්වයකට හුවමාරු කර ගැනීමට, බෙදා ගැනීමට හෝ ලබා දීමට කාගිල්ස් බැංකුව වෙත බලය ලබා දෙනු ලබන අතර කාගිල්ස් බැංකුව මෙම තොරතුරු භාවිතා කිරීම හෝ අනාවරණය කිරීම සම්බන්ධයෙන් වගකීමට ලක් නොකළ යුතුය.

## 15. පාර්ශවයන් අතර සබඳතාවය

අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් ලබා ගැනීම හෝ වෙබ් අඩවිය භාවිතා කිරීම හේතුවෙන් අදාළ පාර්ශවයන් අතර හවුල්කාරිත්ව, බද්ධ ව්‍යාපාර, රැකියා අවස්ථාවන් හෝ නියෝජිත ආයතන සම්බන්ධතාවයන් නොපවතින බවට ඔවුන් විසින් එකඟ වේ. සියලුම ගනුදෙනු පාරිභෝගිකයා විසින් ඇතුලත් කල යුතු අතර එසේ තිබියදී කාගිල්ස් බැංකුව සහ / හෝ එහි අනුබද්ධිතයන්හට පාරිභෝගිකයා වෙත, එම පාර්ශව අතර කුමන ආකාරයේ හෝ දැනට පවතින සබඳතාවක් ඇති බවට කිසිඳු විශ්වස්ත යුතුකමක් නොපවතී.

## 16. සේවාදායකයා විසින් ප්‍රකාශ කිරීම

සේවාදායකයා විසින් කාගිල්ස් බැංකුව වෙත පහත සඳහන් ප්‍රකාශයන් (ගනුදෙනු ඇතුලත් කරනු ලබන සෑම දිනයකදීම පාරිභෝගිකයා විසින් නැවත ප්‍රකාශ කරනු ලබන සේ සලකනු ලබනු ඇති ප්‍රකාශයන්) සිදු කරනු ලබයි.

16.1 පාරිභෝගිකයා / පරිශීලකයා හට මෙහි සඳහන් කර ඇති වගකීම් ඉටු කිරීමට බලය හිමි වන අතර එවැනි ක්‍රියාත්මක කිරීම් , බෙදා හැරීම් සහ කාර්ය සාධනයන් සඳහා බලය ලබා දීමට අවශ්‍ය සියලු ක්‍රියා මාර්ගයන් ගෙන ඇත.

16.02 අවශ්‍ය පරිදි ගනුදෙනු වෙත ඇතුළු වීම සඳහා අභ්‍යන්තර අනුමත කිරීම් වලට අනුකූල වීම පාරිභෝගිකයාගේ / පරිශීලකයාගේ තනි වගකීම වනු ඇත.

16.03 මේ යටතේ පවතින අන්තර්ජාලය හරහා ලබා දෙනු ලබන සේවාවන් ලබා ගැනීම සහ ඕනෑම ගනුදෙනුවක් ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම සහ කාර්ය සාධනය මේ හා අදාළ කිසිඳු නීතියක් සහ / හෝ නියාමන අවශ්‍යතාවයක් (ශ්‍රී ලංකා මහා බැංකුවෙහි මාර්ගෝපදේශන, විනිමය පාලන රෙගුලාසි ආදිය ඇතුලත්ව. එහෙත් ඊට සීමා නොවී) , ව්‍යවස්ථා ලේඛනයන්හි ඕනෑම විධිවිධානයක්, ඕනෑම අධිකරණයක හෝ ඒ සඳහා හෝ එහි ඕනෑම වත්කමක් සඳහා අදාළ වන වෙනත් රජයේ නියෝජිතායතනයක ඕනෑම අණ කිරීමක් හෝ තීන්දුවක් හෝ ඒ සමග බැන්කි ඇති හෝ එයට බලපෑමක් ඇති ගිවිසුම් සීමාවන් හෝ එහි වත්කම් උල්ලංඝනය කිරීමක් හෝ ගැටුම් ඇති කර ගැනීමක් සිදු නොවනු ඇත.

16.04 මෙම කොන්දේසි හා නියමයන්හි හෝ ඒවායෙහි වගකීම් ඉටු කිරීමේ හැකියාවන්හි නිත්‍යානුකූලභාවය, වලංගුභාවය හෝ බලාත්මක කිරීමේ හැකියාවට බලපෑමක් ඇති කිරීමට හැකියාව සහිත ඕනෑම උසාවියක් , විනිශ්ය සභාවක් , රාජ්‍ය ආයතනයක්, නියෝජිතායනතනයක් හෝ නිලධාරියෙකු හෝ තීරකයෙකු ඉදිරියේ විසඳීමට නියමිතව පවතින හෝ තම අනුදනුමට අනුව පාරිභෝගිකයාට එරෙහිව පවතින ඕනෑම ක්‍රියාවක්, නඩුවක්, නිතිය හා සම්බන්ධ ක්‍රියා පටිපාටියක් හෝ ප්‍රාග්ධනයක් පාරිභෝගිකයාට එරෙහිව නොපවතී.  සහ

16.05 පාරිභෝගිකයා විසින් හෝ පාරිභෝගිකයා වෙනුවෙන් කාගිල්ස් බැංකුව වෙත ලිඛිතව ලබා දී ඇති සියලුම අදාළ තොරතුරු, සෑම ලේඛනයකම එම තොරතුරු ලබා දුන් දිනයට අදාලව සත්‍ය, නිරවද්‍ය සහ සම්පූර්ණ තොරතුරු වේ.

16.06 යම් ගනුදෙනුවක් ක්‍රියාත්මක කිරීම සීමා කිරීම හෝ තහනම් කිරීම හා සම්බන්ධ නියාමන අවශ්‍යතාවයන්හි යම් වෙනසක් ඇත්නම් පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව වෙත ඒ බව දන්වා සිටිය යුතුය.

**17. අවසන් කිරීම**

ලබා ගත් අන්තර්ජාල බැංකුකරණ සේවාව පාරිභෝගිකයා විසින් අවසන් කරන්නේ නම් අවම වශයෙන් එක් (1) මසක හෝ ලිඛිත නිවේදනයක් ලබා දිය යුතුය. අන්තර්ජාල බැංකුකරණ සේවාව අවසන් කිරීම, පාර්ශවයන් දෙක අතර සිදු වීම සඳහා ඇතුලත් කරන ලද සියලුම අවසන් නොවූ ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා බාධාවක් නොවන ආකාරයෙන් සිදු කල යුතුය. එවැනි

අවසන් කිරීමක් සිදු කරනු ලබන දිනය දක්වා වූ සියලුම ගාස්තු හා හිඟව පවතින වෙනත් සියලුම මුදල් කාගිල්ස් බැංකුව වෙත හිමි විය යුතුය. මෙම සේවාව අවසන් කිරීමේදී ඒ සඳහා ගෙවිය යුතු ඕනෑම මුදලක් කාගිල්ස් බැංකුව සමග පවතින පාරිභෝගිකයා වෙත හිමි වන ඕනෑම ගිණුමකින් අය කර ගැනීමේ හැකියාව කාගිල්ස් බැංකුව සතු වේ.

ඕනෑම අවස්ථාවකදී කිසිදු හේතු දැක්වීමකින් තොරව අන්තර්ජාල බැංකුකරණ සේවාවන් වෙත පිවිසීම බාධා කිරීමේ, අත්හිටුවීමේ හෝ අවසන් කිරීමේ අයිතිය කාගිල්ස් බැංකුව සතු වන අතර ඒ පිළිබඳ හේතු දැක්වීමකින් තොරව සහ පාරිභෝගිකයාහට කුමන හෝ ආකාරයේ අලාභයක්/හානියක්/පිරිවැයක් සඳහා වගකීමක් දරීමකින් තොරව සුදුසු දැනුම්දීමක් ලබා දීමට හැකිතාක් උත්සාහ දරනු ඇත.

පහත සඳහන් කර ඇති ඕනෑම අවස්ථාවකදී සේවාදායකයා හා සම්බන්ධ සිදුවීමක් වගකීම් පැහැරහරිනු ලැබූ සිදු වීමක් ලෙස සලකා අන්තර්ජාල බැංකුකරණ සේවාවන් අවසන් කිරීමට කටයුතු කරනු ඇත.

I. මෙහි සඳහන් කර ඇති කොන්දේසි හා නියමන්ට අනුකූල වීමට හෝ වගකීම දැරීමට පාරිභෝගිකයාහට නොහැකි වීම හා එවැනි අනුකූල නොවීමක් පිළිබඳ කරන ලද දැන්වීමෙන් පසුව දින 30කට පෙර හෝ එම දිනයෙහි පිළියම් යොදනු නොලැබුවහොත්

II. පාරිභෝගිකයා විසින් සිදු කල හෝ සිදු කලායැයි සලකනු ලබන යම් නිරූපනයක්, එම නිරූපනය කල හෝ කලායැයි සැලකීමෙන් අනතුරුව එය නිරවද්‍ය නොවන බවට හෝ නොමගහැරීමක් බවට ඔප්පුවුව හොත්

III. "අතිරේක අවසන් කිරීමේ අවස්ථාවක්" සිදුවීම;
පාරිභෝගිකයා,

a) වසා දැමීම, නිල කළමනාකරණය හෝ අවසායනය කිරීම සඳහා යෝජනාවක් සම්මත වී තිබීම (සංස්ථාපනය කිරීමක්, ඒකාබද්ධ කිරීමක් හෝ සංගත කිරීමක් යටතේ හැර)

b) බංකොලොත්භාවයට පත් වීම හෝ ණය මුදල් ගෙවීමට අපොහොසත් වීම හෝ ණය මුදල් හිඟ බවට පත්වීමෙන් අනතුරුව සාමාන්‍ය ආකාරයෙන් ඒවා නැවත පියවීමට ඇති නොහැකියාව ලිඛිතව ලබා දී තිබීම.

c) ණයහිමියන් සමග හෝ ඔවුන්ගේ ප්රයෝජනය වෙනුවෙන් සාමාන්‍ය පැවරීමක්, විධිවිධානයක් හෝ සංයුතියක් සැකසීම.

d) බුන්වත්බව හෝ වස්තුභංගත්වය පිලිබඳ තීන්දුවකට එරෙහිව පනවන හෝ ඊට එරෙහිව පනවා තිබෙන හෝ යම් බුන්වත්බවක් හෝ වස්තුභංගත්වයක් හා අදාළ නීති හෝ ණය හිමියාගේ අයිතීන්ට බලපානු ලබන වෙනත් ඊට සමාන නීතියක් යටතේ ඕනෑම සහනයක් හෝ වසා දැමීම හෝ ඈවර කිරීම පිලිබඳ ඉදිරිපත් කරනු ලබන පෙත්සමක් සහ එවැනි පැනවීමක් හෝ පෙත්සමක් සිදු වූ අවස්ථාවකදී එම පැනවීම හෝ පෙත්සම

- බුන්වත්බව පිලිබඳ තීන්දුවක ප්‍රතිඵලයක් හෝ බංකොලොත්භාවය හෝ සහන ලබා දීම සඳහා නියෝගයක් ඇතුලත් කිරීම හෝ එය අවසන් කිරීම හෝ අවසායනය කිරීම සඳහා නියෝගයක් සැකසීම හෝ
- සංස්ථානය හෝ ඉදිරිපත් කිරීමෙන් දින 30ක් ඇතුලත සෑම අවස්ථාවකදීම ඉවත දැමීමක්, පිටවීමක්, නතර කිරීමක් හෝ වැලැක්වීමක් සිදු නොවීම

e) ඒ සඳහා හෝ එහි සියලුම හෝ සැලකිය යුතු ප්‍රමාණයෙන් සියලුම වත්කම් සඳහා පරිපාලකයෙකු, යාවකාලික අවසායකයෙකු, සංරක්ෂකයෙකු, ග්‍රාහකයෙකු, භාරකරුවකු, අත්භාරකරුවකු හෝ වෙනත් එවැනි නිලධාරියෙකු පත් කිරීමට යටත් වීම හෝ එසේ කිරීමට බලාපොරොත්තු වීම

f) එක් එක් අවස්ථාව සඳහා දින 30ක් ඇතුලත ආරක්ෂිත පාර්ශවයක් එහි සියලු හෝ සැලකිය යුතු ප්‍රමාණයෙන් සියලු වත්කම් හිමි කර ගෙන සිටිමින් හෝ ආපදා, ලියා අත්සන් කිරීම්, සම්බන්ධිතයන්, අත්පත් කර ගැනීම් හෝ සියලු හෝ සැලකිය යුතු ප්‍රමාණයෙන් සියලු වත්කම් මත හෝ ඊට එරෙහිව අය කරනු ලබන, බලාත්මක කරනු ලබන හෝ නඩු පවරනු ලබන වෙනත් නීතිමය ක්‍රියාවලියක් සහ එවැනි සුරක්ෂිත පාර්ශවයක් හිමිකාරිත්වය පවත්වාගෙන යනු ලබන හෝ එවැනි ඕනෑම ක්‍රියාවලියක් ඉවත් කර, මුදා හැර, නවත්වා හෝ මැඩපවත්වා නොමැති වීම

g) ඕනෑම අධිකරණ බලයක අදාළ නීති යටතේ ඕනෑම සිදුවීමකට (a) සිට (f) දක්වා වගන්ති වල (එම වගන්ති දෙකද ඇතුලත්ව) නිශ්චිතව දක්වා ඇති අකාරයේ ප්‍රතිසම බලපෑමක් පවතින ඕනෑම සිද්ධියක් සඳහා අදාළ වේ.

h) ඉහත සඳහන් ඕනෑම ක්‍රියාවක් අනුමත කිරීම හෝ අහෝසි කිරීමක් සඳහා සිය කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

**18. වගකීමෙහි සීමාව**

ලබා දී ඇති අන්තර්ජාල සේවාවන්හිදී පහත සඳහන් කරුණු වල සාවද්‍යතාවය, දෝෂ හෝ ප්‍රමාදයන් හෝ එම කරුණු පහර හැරීමක් හෝ පිලිබඳ වගකීම, සීමාසහිත කාගිල්ස් බැංකුව විසින් දරනු නොලැබේ.

I. ඕනෑම දත්ත, තොරතුරු හෝ පණිවිඩ, හෝ

II. එවැනි ඕනෑම දත්ත, තොරතුරු හෝ පණිවිඩ සම්ප්‍රේෂණය හෝ ලබා දීම; හෝ

III. පහත කරුණු හේතුවෙන් පැනනගින හෝ එම කරුණු හේතුව සිදු වන පාඩුවක් හෝ අලාභයක්

a) එවැනි සාවද්‍යභාවයක්, දෝෂයක්, ප්‍රමාදයක් හෝ පහර හැරීමක් හෝ
b) කාර්යසාධානයෙන් තොර වීමක් හෝ
c) එවැනි ඕනෑම දත්ත, තොරතුරු හෝ පණිවිඩ වලට සිදුවන බාධාවන් හෝ 'මැඩලිය නොහැකි බලපෑම් හේතුවෙන්' (උදා; ගංවතුර, අසාමාන්‍ය කාලගුණික තත්වයන්, භූමිකම්පා හෝ වෙනත් ස්වභාවික විපත්, ගිනි ගැනීම්, යුධමය තත්වයන්, කැරලි කෝලාහල, කැළඹීම්, කම්කරු ආරවුල්, හදිසි අනතුරු, පවතින ආණ්ඩුවෙහි ක්‍රියාවන්, සන්නිවේදනය, බලශක්ති බිඳවැටීම්, උපකරණ හෝ මෘදුකාංග අක්‍රීය වීම) අවශ්‍ය ආකාරයෙන් ගිණුම් වෙත ප්‍රවේශ වීමට හැකියාවක් නොමැති වීම හෝ කාගිල්ස් බැංකුවෙහි යුක්ති සහගත පාලනයෙන් තොර වෙනත් ඕනෑම හේතුවක්

පහත සඳහන් කරුණු වලදී පාරිභෝගිකයා විසින් වහාම කාගිල්ස් බැංකුව වෙත ලිඛිතව ලියා, තමා විසින් ගෙනවිත් භාර දීම හරහා හෝ ලියාපදිංචි තැපැල මගින් හෝ ෆැක්ස් මාර්ගයෙන් හෝ ආයතනික අන්තර්ජාල බැංකුකරණ සේවාව හරහා අන්තර්ජාලය ඔස්සේ පණිවිඩයක් එවීම මගින් හෝ දැනුම් දෙනු ඇත.

a) පාරිභෝගිකයාගේ පරිශීලක හැඳුනුම සහ මුර පදය අස්ථාන ගත වූ බව, සොරාගත් බව හෝ අනවසර භාවිතයක් පිලිබඳ පාරිභෝගිකයා විසින් දැනගත හොත්; හෝ
b) පාරිභෝගිකයා විසින් ලබා දෙනු ලබන යම් නියමයක් ලැබුණු බව සහ එම නියමය ක්‍රියාත්මක කල බවට කාගිල්ස් බැංකුව විසින් එවනු ලබන පණිවිඩ ලබා ගැනීමට පාරිභෝගිකයා අසමත් වුවහොත්; හෝ
c) නියමය ක්‍රියාත්මක කල බවට ලබා දෙන නිරවද්‍යා ලිඛිත තහවුරු කිරීමක් ලබා ගැනීමට පාරිභෝගිකයා අසමත් වුවහොත්; හෝ
d) පාරිභෝගිකයා විසින් ලබා නොදුන් නියමයක් සහ / හෝ නියම ක්‍රියාත්මක කිරීමක් පිලිබඳ තහවුරු කිරීමක් පාරිභෝගිකයා වෙත ලැබුනහොත්; හෝ
e) පාරිභෝගිකයාගේ ගිණුමෙහි ශේෂය හෝ ගනුදෙනු ඉතිහාසයෙහි ඇති නිරවද්‍යා නොවන ඕනෑම තොරතුරක්

ඉහත සඳහන් ඕනෑම අවස්ථාවක් සිදු වූ විටකදී පාරිභෝගිකයාගේ දැනුම මත පාරිභෝගිකයා විසින් වහාම කාගිල්ස් බැංකුව වෙත දැනුම් දීමට අපොහොසත් වුව හොත් කාගිල්ස් බැංකුව හෝ එහි නිලධාරීන්, අධ්‍යක්ෂකවරුන්, සේවකයින්, නියෝජිතයින් විසින් යම් නියමයක් හැසිරවීම, නිසි පරිදි නොහැසිරවීම හෝ අස්ථානගත වීම හා සම්බන්ධව වන කිසිඳු හිමිකමක් සඳහා පාරිභෝගිකයා හෝ පාරිභෝගිකයා හරහා හිමිකම් ප්‍රකාශ ලබන වෙනත් ඕනෑම පුද්ගලයෙකු වෙත කිසිඳු වගකීමේ හෝ වගවීමේ හැකියාවක් හෝ එසේ කිරීමක් සිදු නොවනු ඇත. දැනුම් දීමක් මත කාගිල්ස් බැංකුව පාරිභෝගිකයාගේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍යා පරිදි නවතා තැබීමට හෝ අවශ්‍යා පියවර ගැනීමට කටයුතු කරනු ඇති අතර එම පියවර ගැනීමට කාගිල්ස් බැංකුව වෙත හැකියාව සහ අවසරය පැවතිය යුතුය. දැනුම්දීම ලබා දීමට පෙර සිදුවන ඕනෑම පාඩුවක් හෝ අලාභයක් පාරිභෝගිකයාගේ ගිණුමට බැර වේ.

කිසිඳු හේතුවක් නිසා කාගිල්ස් බැංකුව, එහි සේවකයින්, අධ්‍යක්ෂකවරුන්, සහ අන්තර්ජාල සේවාවන් නිර්මාණය කිරීම, සැකසීම, බෙදා හැරීම හෝ කළමනාකරණය යනාදියෙහි සම්බන්ධ වී සිටින තුන් වන පාර්ශවයේ නියෝජිතයින් විසින් වෙබ් අඩවිය/ අන්තර්ජාල සේවාවන් භාවිතා කිරීම, බෙදා හැරීම හේතුවෙන්, වෙබ් අඩවිය/ අන්තර්ජාල සේවාවන් හෝ වෙබ් අඩවියෙහි / අන්තර්ජාල සේවාවෙහි ඇති ඕනෑම දිගුවක් භාවිතා කිරීමේදී ඇතිවන ප්‍රමාදයක් හෝ භාවිතා කිරීමට නොහැකි වීමක්, සේවාවන් සැපයීම පිලිබඳ කිසියම් අඩුපාඩුවක් හෝ ප්‍රමාණවත් නොමැති වීමක් හෝ අනවසර ඇතුළුවීමක් හෝ සම්ප්‍රේෂණ හෝ දත්ත විකෘති කිරීමක් හෝ අන්තර්ජාල සේවා සැපයීමට බාධා කිරීම, අත්හිටුවීම හෝ අවසන් කිරීම හේතුවෙන් පැනනගින හෝ ඕනෑම මෘදුකාංග ස්ථාපන උපදෙස් වලට අනුකූල වීම සඳහා සේවාදායකයා අසමත් වීම හේතුවෙන් ඇතිවන ඕනෑම අලාභයක් සඳහා හෝ කුමන හෝ ඕනෑම හේතුවක්

නිසාවෙන් පාරිභෝගිකයාගෙන් ලැබෙන උපදෙස්, විධාන, නියෝග හෝ වෙනත් සන්නිවේදනයන් ලබා ගැනීමට කාගිල්ස් බැංකුවට නොහැකි වීම හෝ කිසිඳු අදාළ පණිවිඩයක් යැවීමට නොහැකි වීම හෝ කාගිල්ස් බැංකුව ගනුදෙනු හෝ සේවාදායකයාගෙන් ලැබෙන හෝ ගිවිසුම්, වන්දි, දැඩි වගකීම් මත පදනම්ව හෝ වෙනත් ආකාරයකින් වුවද, සේවාදායකයාගේ මුරපදය මගින් සහතික කර ඇති ලේඛන මත රඳා පවතින උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි ඕනෑම ප්‍රතිවිපාකයක් හේතුවෙන් පැනනගින හෝ කුමන හෝ ආකාරයකින් සම්බන්ධ වී පවතින ඕනෑම ඍජු, වක්‍ර, අනියම්, විශේෂ හෝ ආනුෂංගික හානි හෝ දණ්ඩනීය හෝ ආදර්ශවත් හානි (ඕනෑම වයිරසයක්, පුද්ගලික තුවාල, නොසැලකිලිමත්කම, ලාභ අහිමි වීම්, දත්ත හෝ වෙනත් ස්පර්ශ කල නොහැකි දත්ත නැති වීම්, ව්‍යාපාර අතරමැද නැවතීම්, පුද්ගලිකත්වය අහිමි වීම් හෝ වෙනත් මූල්‍යමය අලාභයකින් සිදු වූ හානි ද ඇතුලත්ව, එහෙත් ඊට සිමා නොවී) ද ඇතුලත්ව කුමන හෝ ආකාරයක හානියක් සඳහා වග කියනු නොලැබේ.

**19. අන්තර්ජාල සේවාවන් අවහිර කිරීම**

මෙහි ලබා දී ඇති අන්තර්ජාල සේවාව කුමන හෝ ඕනෑම හේතුවක් නිසාවෙන් අවහිර වූ අවස්ථාවකදී පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව ඇමතිය යුතුය. සේවාවෙහි සිදුවන ඕනෑම අවහිරවීමක් නිසාවෙන් ඇතිවන ප්‍රතිවිපාකයන් සඳහා කාගිල්ස් බැංකුව කිසිසේත් වගකිව යුතු නොවේ.

**20. පාරිභෝගිකයාගෙන් මුදල් ලබා ගැනීම**

පාරිභෝගිකයාට හිමි සියලුම මුදල් සහ වෙනත් වත්කම්, කාගිල්ස් බැංකුව විසින් වෙනම ගිණුමක හෝ එයට හිමි වත්කම් වලින් වෙන්ව තබා ගනු ඇති අතර එය පාරිභෝගිකයා විසින් නියම කරන ලද පරිදි හෝ මෙම කොන්දේසි හා නියමයන් යටතේ බලය ලබා දී ඇති පරිදි හෝ අදාළ කාල සීමාවට නියමිත කොන්දේසි, රෙගුලාසි හෝ නීති වලට අවශ්‍ය අන්දමට හැර වෙනත් කිසිඳු අවශ්‍යතාවයක් සඳහා භාවිතා නොකරනු ඇත. ගිණුම වෙත හා ඒ වෙතින් සිදුවන මුදල් හුවමාරු, පාරිභෝගිකයා විසින් නිසි පරිදි බලය පවරමින් ලබා දෙනු ලබන ස්ථාවර හෝ නිශ්චිත නියෝග, උපදෙස්, මගපෙන්වීම් හෝ අයදුම්පත මත පදනම්ව සිදු කිරීමට කාගිල්ස් බැංකුව භාර ගනී.

**21. අන්තර්ජාල සේවාවන් වෙනස් කිරීමට ඇති අයිතිය සහ අන්තර්ජාල සේවාව සඳහා අදාළ කොන්දේසි හා නියමයන්**

වෙබ් අඩවිය හරහා ලබා දී ඇති ඕනෑම අන්තර්ජාල සේවාවක් සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් එකතු කිරීමට, වෙනස් කිරීමට, ප්‍රතිශෝධනයට, අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට කාගිල්ස් බැංකුවට අයිතිය හිමි වන අතර ඒ පිලිබඳ පාරිභෝගිකයා වෙත සුදුසු නිවේදනයක් ලබා දීමට උපරිම ප්‍රයත්න දරනු ඇත. වෙබ් අඩවියේ දක්වා ඇති අකාරයේ කොන්දේසි වල ඕනෑම එකතු කිරීමක්, අත්හිටුවීමක්, ප්‍රතිශෝධනයක්, වෙනස් කිරීමක්, අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක්, එම වෙබ් අඩවියේ පල කරනු ලබන නිවේදනයක් මගින් දැක්වීම කාගිල්ස් බැංකුව විසින් සිදු කරනු ඇති අතර පාරිභෝගිකයා විසින් එම එකතු කිරීම, අත්හිටුවීම, ප්‍රතිශෝධනය, වෙනස් කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීම එසේ දැනුම් දීමෙන් අනතුරුව වෙබ් අඩවිය හරහා ගනුදෙනුවක් සිදු කිරීම මගින් ඉහත වෙනස් වීම් පිළිගත් බවට සලකනු ලැබේ. කාගිල්ස් බැංකුව විසින් කලින් කලට වෙබ් අඩවිය/අන්තරජාල සේවාවන් හා සම්බන්ධ නව සේවාවන් හඳුන්වා දෙනු ඇත. නව අන්තරජාල සේවාවන්හි පැවැත්ම සහ උපයෝජ්‍යතාවය, ඒවා ලබා ගැනීමේ හැකියාව ඇති වූ අවස්ථාවේදී වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ඇත.

## 22. භාවිතය පිලිබඳ සීමාවන්

පාරිභෝගිකයා විසින් වෙබ් අඩවිය / අන්තර්ජාල සේවාවන් එහි අපේක්ෂිත භාවිතය සඳහා පමණක් භාවිත කිරීමට සහ කිසිඳු නීති විරෝධී කටයුත්තක් සඳහා හෝ කොන්දේසි හා නියමයන්ට අනුකූල නොවන ආකාරයට භාවිතා නොකිරීමට මෙයින් එකඟ වේ. වෙබ් අඩවියෙහි/අන්තර්ජාල සේවාවෙහි සඳහන් කිසිඳු තොරතුරක් කාගිල්ස් බැංකුවෙහි සහ / හෝ එහි අනුබද්ධිත ආයතනයන්හි හෝ වෙනත් ආයතනයන්හි ව්‍යාපාර කටයුතු සමග තරග කල හැකි ඕනෑම ආකාරයකින් හෝ කාගිල්ස් බැංකුව සහ / හෝ එහි අනුබද්ධිත ආයතනයන් අපහසුතාවයට පත් කරන හෝ අන්තරායට පමුණුවන අකාරයෙන් භාවිතා කිරීම, හුවමාරු කිරීම, ලබා දීම හෝ බැහැර කිරීම සිදු නොකිරීමට පාරිභෝගිකයා එකඟ වේ. කාගිල්ස් බැංකුව සහ අනෙකුත් අය විසින් (වෙනත් තොරතුරු මූලාශ්‍රද ඇතුලත්ව) විනිශ්චය කිරීමේ ක්‍රමවේදයන් හා ප්‍රමිති භාවිතයෙන් වෙබ් අඩවිය දියුණු කර, සම්පාදනය කර, සූදානම් කර, සංශෝධනය කර, තෝරාගෙන සහ සංවිධානයක කර එමෙන්ම සැලකිය යුතු කාලයක්, ශ්‍රමයක් සහ මුදලක් වැය කර ඒවා ක්‍රියාවට නංවා ඇති බවට සහ එය කාගිල්ස් බැංකුවෙහි වටිනා බුද්ධිමය දේපලක් බවට පත් වී ඇති බවටද කාගිල්ස් බැංකුවෙහි සහ වෙනත් එවැනි අයගේ වෙළඳ රහස් ඇතුලත් විය හැකි බවටද පාරිභෝගිකයා පිළිගනී. අන්තර්ජාල සේවාවන් ලබා ගනු ලබන කාලය තුල හා ඉන් අනතුරුව කාගිල්ස් බැංකුවෙහි සහ වෙනත් පාර්ශවයන්ගේ හිමිකාර අයිතීන් ආරක්ෂා කිරීමට සහ කාගිල්ස් බැංකුව හෝ එහි සැපයුම්කරුවන් විසින් වෙබ් අඩවියෙහි / අන්තර්ජාල සේවාවන්හි ඔවුන්ගේ සහ වෙනත් පාර්ශවයන්ගේ ගිවිසුම්ගත, ව්‍යවස්ථාමය සහ පොදු නීති අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා එහි අන්තර්ගතය, උපකරණ හෝ වෙනත් කරුණක් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන සාධාරණ ලිඛිත ඉල්ලීම් ඉටු කිරීමටත් පාරිභෝගිකයා එකඟ වේ. වෙබ් අඩවිය /

අන්තර්ජාල සේවාවන් වෙත ඕනෑම පාර්ශවයක් විසින් අනවසර පිවිසුමක් හෝ භාවිතයක් පිලිබඳ හෝ වෙබ් අඩවිය / අන්තර්ජාල සේවාවන්හි ප්‍රකාශන අයිතීන්, වෙළඳ ලකුණු හෝ වෙනත් ගිවිසුම්ගත, ව්‍යවස්ථාපිත හෝ පොදු නීති අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් පිලිබඳ දැනගත් විටකදී ඒ බව කාගිල්ස් බැංකුව වෙත වහාම ලිඛිතව දැනුම් දීමට පාරිභෝගිකයා එකඟ වේ. පාරිභෝගිකයාගේ පරිගණක තිරය මත වෙබ් අඩවියෙන් දත්ත බාගත කර ගැනීම, කඩදාසි මත තනි පිටු මුද්‍රණය කිරීම, ඡායා පිටපත් ගැනීම සහ එවැනි පිටු ඉලෙක්ට්‍රොනික ආකෘතියකින් තැටි මත ගබඩා කිරීම සිදු කල හැක්කේ පොදු නොවූ පුද්ගලික භාවිතය සඳහා පමණි.වෙබ් අඩවියෙහි/ අන්තර්ජාල සේවාවන්හි සහ ලබා දෙනු ලබන සේවාවන්හි ඇති සියලු බුද්ධිමය දේපල කාගිල්ස් බැංකුව සතු වන බව පාරිභෝගිකයා විසින් තවදුරටත් පිලි ගනී.

පහත දක්වා ඇති කැරුණු පාරිභෝගිකයා විසින් සිදු නොකළ යුතුය.

I. කොන්දේසි හා නියමයන් සහ ශ්‍රී ලංකාව තුල පවතින නිතිය කඩ කිරීමක් සිදුවන ආකාරයෙන් ඍජුව හෝ වක්‍රාකාරයෙන් ඕනෑම අන්තර්ජාල සේවාවකින් අයුතු ප්‍රයෝජනයක් ලබා ගනිමින් ප්‍රතිවර්තනය, සකස් කිරීම, විඡේදනය, විසුරුවා හැරීම, පිටපත් කිරීම, ප්‍රතිනිෂ්පාදනය, බෙදා හැරීම, වෙනස් කිරීම, සම්ප්‍රේෂණය, ක්‍රියා කරවීම, ප්‍රතිනිෂ්පාදනය, ප්‍රකාශයට පත් කිරීම හෝ ව්‍යුත්පන්න ක්‍රියාවන් නිර්මාණය;

II. අවස්ථාවට අනුව සියලුම හෝ ඕනෑම සේවාවක් ක්‍රමාණුකූලව බාගත කර ගැනීම සහ ගබඩා කිරීම මගින් විද්‍යුත් හෝ ව්‍යුහාත්මක ආකෘතියක් ලෙස දත්ත සමුදා නිර්මාණය, ගබඩා කර තබා ගැනීම සහ එවැනි තොරතුරු ගනුදෙනුකරුගේ ගිණුම් හා ගනුදෙනු වලට අදාළ වේ නම් ;

III. වෙනත් පුද්ගලයෙකු සතු වෙබ් අඩවිය සහ අන්තර්ජාල සේවාවන් වෙත පිවිසීමේ හැකියාව කුලියට ගැනීම, කල්බදු ක්‍රමය, විකිණීම, ප්‍රසිද්ධ කිරීම හෝ ණයට ලබා දීම;

IV. ඕනෑම පුද්ගලයෙකු විසින් රහසේ භාවිත කිරීම හෝ රහසේ භාවිතා කිරීමට අවසර ලබා දීම;

V. වෙබ් අඩවියෙහි හෝ එමගින් ලබා දී ඇති අන්තර්ජාල සේවාවන්හි දක්වා ඇති පරිදි, කාගිල්ස් බැංකුවෙහි හෝ වෙනත් ඕනෑම තුන්වන පාර්ශවයක බුද්ධිමය දේපල අයිතිය උල්ලංඝනය කරන යම් ක්‍රියාවක් සිදු කිරීම;

VI. ඕනෑම වෙබ් අඩවි පරිශීලකයෙකුගේ රහස්‍ය පදය හෝ පුද්ගලික තොරතුරු වංචාසහගත ලෙස ලබා ගැනීමට හෝ සැලසුම් කිරීමට අදහස් කරන ඕනෑම ක්‍රියාකාරකමක්ද ඇතුලත්ව එහෙත් ඊට සීමා නොවී ඕනෑම වංචාකාරී, අපවාදාත්මක හෝ නීති විරෝධී කටයුත්තක යෙදීම;

VII. ඕනෑම පරිගණක ජාලයක ආරක්ෂාව උල්ලංඝනය කිරීම, වෙනත් ඕනෑම පරිශීලකයෙකුගේ මුර පදය හෝ ආරක්ෂණ සංකේත කේතයන් බිඳහෙලීම, තර්ජනාත්මක හෝ අසභ්‍ය කරුණුද ඇතුලත්ව නීතිවිරෝධී දෑ මාරු කිරීම හෝ ගබඩා කිරීම සඳහා වෙබ් අඩවිය හෝ අන්තර්ජාල සේවාවන් භාවිතය;

## 23. හිමිකම් සහ බුද්ධිමය දේපල අයිතීන්

වෙබ් අඩවියෙහි / අන්තර්ජාල සේවාවන්හි ප්‍රදර්ශනය කර ඇති ප්‍රතිරූපණ අයිතිය, වෙළඳ ලකුණු, ලාංඡන, පාඨයන් හා සේවා සලකුණු ආදිය කාගිල්ස් බැංකුවෙහි හෝ අදාළ බුද්ධිමය දේපල අයිතීන් හිමිකරුවන්ගේ ලියාපදිංචි හා ලියාපදිංචි නොකළ බුද්ධිමය දේපල අයිතීන් වේ. වෙබ් අඩවියෙහි / අන්තර්ජාල සේවාවන්හි අඩංගු කිසිවක් අනුමැතියක්, පරිබාධකයක් හෝ වෙනත් ආකාරයක් මගින් ප්‍රදානය කිරීමක්, කාගිල්ස් බැංකුවෙහි හෝ එවැනි වෙබ් අඩවියෙහි / අන්තර්ජාල සේවාවන්හි ප්‍රදර්ශනය කර ඇති බුද්ධිමය දේපල වලට හිමිකම් ඇති තෙවන පාර්ශවයක් මගින් ලබා දෙනුලබන ලිඛිත අවසරයක් නොමැතිව ඕනෑම බුද්ධිමය දේපලක් භාවිතා කිරීම සඳහා ලබා දෙනු ලබන බලපත්‍රයක් හෝ අයිතියක් නොවන බව තේරුම් ගත යුතුය.

පාරිභෝගිකයා විසින් වෙබ් අඩවියෙහි / අන්තර්ජාල සේවාවන්හි දක්වා ඇති කරුණු භාවිතය, කාගිල්ස් බැංකුවට හෝ එහි අනුබද්ධ ආයතනයන්ට හිමි නොවන පේටන්ට් අයිතිය, ප්‍රකාශන හිමිකම් හෝ ඕනෑම බුද්ධිමය දේපල අයිතීන් හෝ තුන්වන පාර්ශවයන්ගේ වෙනත් ඕනෑම අයිතියක් වෙනත් ඕනෑම තුන්වන පාර්ශවයක් අයිතීන් උල්ලංඝනය කිරීමක් නොවන බවට කාගිල්ස් බැංකුව ඇප වීමක් හෝ නියෝජනයක් නොකෙරේ.  කාගිල්ස් බැංකුව, කොන්දේසි හා නියමයන්ට අනුකූලව පාරිභෝගිකයා හට වෙබ් අඩවිය / අන්තර්ජාල සේවාවන් වෙත පිවිසීමේ සහ අන්තර්ජාල සේවාවන් භාවිතා කිරීමේ අයිතිය ලබා දෙයි.

කාගිල්ස් බැංකුව, අපරාධ නඩු පැවරීමද ඇතුලත්ව නීතියෙහි උපරිම මට්ටම දක්වා තම බුද්ධිමය දේපල අයිතීන් දැඩි ලෙස බලාත්මක කරන බවට සේවාදායකයාට උපදෙස් දෙනු ලැබේ. මෙම කොන්දේසි හා නියමයන්හි සඳහන් භාවිතය සඳහා වන සීමාවන් උල්ලංඝනය කිරීම විශේෂයෙන්ම නීතිමය වශයෙන් තහනම් වන අතර එය බරපතල සිවිල් හා අපරාධ සඳහා වන දඬුවම් වලටද හේතු විය හැක. එම කාලය තුල කාගිල්ස් බැංකුව හට ඔවුන්ට වැදගත් වූ කරුණු වෙනුවෙන් හිමිවන විකල්පමය සහනයන්ට ඉහලින් ප්‍රාග්ධන සහන (සියලුම හානි, සෘජු, වක්‍ර, ආනුෂාංගික සහ ආදර්ශවත් ආදියද ඇතුලත්ව) ලබා ගැනීමට අයිතිය පවතී. අන්තර්ජාල සේවාවන්ට පාදක වූ මෘදුකාංග මෙන්ම සේවාව වෙත පිවිසීම සඳහා අවශ්‍ය වන අන්තර්ජාලය හා සම්බන්ධ අනෙකුත් මෘදුකාංග, අදාළ විකුනුම්කරුවන්ගේ නීතිමය දේපල බව සේවාලාභියා විසින් පිළිගනී. අන්තර්ජාල සේවාවන් වෙත ප්‍රවේශ වීමට කාගිල්ස් බැංකුව විසින් ලබා දී

ඇති අවසරය, ඉහත මෘදුකාංගයන් සඳහා වන කිසිදු ජේටන්ට් බලපත්‍රයක්, ප්‍රකාශන හිමිකම ආණ්ඩ බලපත්‍ර, හිමිකාරිත්වය හා උරුමය පිලිබඳ අයිතීන් හෝ වෙනත් බුද්ධිමය දේපල අයිතීන් පවරා දීමක් සිදු නොවේ.

## 24. විශේෂිත අවස්ථා / තාක්ෂණික දුෂ්කරතා

කිසිදු හෝ සියලුම හිමිකම හේතුවෙන් කාගිල්ස් බැංකුවට හානිකර නොවන ආකාරයෙන් පවත්වාගෙන යාමට සහ කාගිල්ස් බැංකුව සැබෑ හෝ ප්‍රත්‍යක්ෂ, ඍජුව හෝ වක්‍රාකාරයෙන් ශ්‍රී ලංකා මහා බැංකුවෙහි / රජයෙහි සීමාවන්, විනිමය පාලන හෝ වෙළඳපොල නියාමන, යුධ, වර්ජන, වෛරස් ප්‍රහාර, උපකරණ බිඳ වැටීම්, සන්නිවේදන මාර්ග බිඳ වැටීම, පද්ධති බිඳ වැටීම්, අන්තර්ජාලයෙහි ආරක්ෂාව බිඳ වැටීම්, අනවසර ප්‍රවේශවීම්, සොරකම හෝ වෙනත් ගැටළු, තාක්ෂණික හෝ වෙනත් ආකාරයකින් හෝ පාරිභෝගිකයින් ඇතුළු වීම වලක්වනු ලබන හෝ කාගිල්ස් බැංකුව මගින් උපදෙස්, නියෝග , නියමයන් පිළිපැදීම වලක්වනු ලබන, කාගිල්ස් බැංකුවෙහි පාලනයෙන් තොර වෙනත් තත්ත්ව හේතුවෙන් ඇති වූ කිසිදු අලාභ, කිසිදු ප්‍රතිඵලයක් සඳහා වගකියනු නොලැබේ. කාගිල්ස් බැංකුව විසින් පාරිභෝගිකයා වෙත "අහිමි වූ අවස්ථා", එනම් ක්‍රියාත්මක කල නොහැකි වූ උපදෙස්, නියෝග , නියමයන් මත කාල්පනික ලාභය සඳහා වන්දි පිරිනමනු නොලබන බවට පාරිභෝගිකයා තවදුරටත් එකඟ වේ.

## 25. වෙබ් අඩවි සඳහා සබැඳි

වෙනත් පාර්ශවයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් වේද අඩවි වෙත ඇති සබැඳි මෙම වෙබ් අඩවිය සතු විය හැක. එවැනි සබැඳි, පාරිභෝගිකයාගේ පහසුව සඳහා පමණක් ලබා දී ඇති අතර කාගිල්ස් බැංකුව විසින් එවැනි වෙබ් අඩවි පාලනය කිරීම හෝ අනුමත කිරීමක් සිදු නොවන අතර ඒවායේ අන්තරගතය සඳහා වගකියනු නොලැබේ. එවැනි වෙබ් අඩවි භාවිතය, අදාළ වෙබ් අඩවියෙහි දක්වා ඇති භාවිතා කිරීම හා සම්බන්ධ කොන්දේසි හා වෙනත් කොන්දේසි සහ මාර්ගෝපදේශයන් වේ නම් ඒවාට යටත් වේ. මෙහි දක්වා ඇති ඕනෑම කොන්දේසියක්, එවැනි ඕනෑම වෙබ් අඩවියක දක්වා ඇති භාවිතා කිරීම හා සම්බන්ධ කොන්දේසි සහ මාර්ගෝපදේශ සමග විරුද්ධ වේ නම්, එම වෙබ් අඩවි සඳහා වන භාවිතා කිරීමේ කොන්දේසි සහ වෙනත් කොන්දේසි හා මාර්ගෝපදේශයන් තවදුරටත් පවතිනු ඇත. එසේ සබැඳි කරන ලද වෙබ් අඩවි, කාගිල්ස් බැංකුවෙහි පාලනය යටතේ නොපවතින අතර ඕනෑම සම්බන්ධිත වෙබ් අඩවියක අන්තර්ගතය හෝ එම සම්බන්ධිත වෙබ් අඩවි තුල දක්වා ඇති සබැඳි වල අන්තර්ගතය, එහි ප්‍රදර්ශනය වන වෙළඳ දැන්වීම්, එමගින් පිරිනමනු ලබන සේවාවන් හෝ එම වෙබ් අඩවි වල සිදුවන යම් වෙනස්කම් හෝ යාවත්කාලින කිරීම් සඳහා වගකීමක් නොදරයි. මෙම වෙබ් අඩවිය

තුල කාගිල්ස් බැංකුව මගින් මෙහෙයවනු ලබන වෙබ් අඩවි, වෙබ් පිටු සහ සේවාවන් ('කාගිල්ස් බැංකු වෙබ් අඩවි') සඳහා සබැඳි දක්වා තිබිය හැකි අතර සෑම පාරිභෝගික භාවිතයට ලක්වන කාගිල්ස් වෙබ් අඩවි, මෙහි දක්වා ඇති කොන්දේසි හා නියමයන්ට සහ එවැනි කාගිල්ස් බැංකු වෙබ් අඩවි පාලනය කරනු ලබන වෙනත් කොන්දේසි හා මාර්ගොපදේශයන් ඇත්නම් ඒවාටද යටත් වේ. මෙහි දක්වා ඇති ඕනෑම කොන්දේසි, නියම සහ දැන්වීම්, එවැනි කාගිල්ස් බැංකු වෙබ් අඩවි පාලනය කරනු ලබන වෙනත් කොන්දේසි හා නියමයන් සමග පරස්පර වන අවස්ථාවකදී, එම කාගිල්ස් බැංකු වෙබ් අඩවි පාලනය කරනු ලබන වෙනත් කොන්දේසි හා නියමයන් තවදුරටත් බලපැවැත්වෙනු ඇත.

## 26. පරිශීලකයින් වෙනස් කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටිය

පාරිභෝගිකයා විසින් යෝජනාවක් ලබා දීම මගින් හෝ කාගිල්ස් බැංකුව විසින් නියම කර ඇති ආකෘතියට අනුව ඉල්ලුම් කිරීම මගින් දැනට පවතින පරිශීලක බලය අවලංගු කිරීම, පරිශීලක ප්‍රවේශ ආකෘතිය වෙනස් කිරීම/ නව පරිශීලකයෙකු සඳහා බලය ලබා දීම සිදු කල හැක. කෙසේ වුවද, මෙහි සඳහන් සියලුම කොන්දේසි හා නියමයන් අඛණ්ඩව අදාළ වේ. බලයලත් පරිශීලකයෙකු සේවාලාභියාගේ සේවාවන්ගෙන් ඉවත් වූ අවස්ථාවකදී, එම පරිශීලක ප්‍රවේශය අක්‍රීය කිරීම සඳහා සේවාලාභියා විසින් වහාම කාගිල්ස් බැංකුවට ඒ බව දැනුම් දිය යුතු අතර එහිදී කාගිල්ස් බැංකුවට ඒ සඳහා අවශ්‍ය වන සාධාරණ කාල සීමාවක් ලබා දිය යුතුය. කාගිල්ස් බැංකුව විසින් අදාළ පරිශීලක ප්‍රවේශය අක්‍රීය කරන තුරු පාරිභෝගිකයා විසින් සිදු කරනු ලබන ගනුදෙනු සියල්ල පාරිභෝගිකයා සමග බැඳී පවතී.

## 27. රඳවුම් බද්ද අඩු කිරීම

මෙම කොන්දේසි හා නියමයන් යටතේ හෝ ඒ හා සම්බන්ධව කාගිල්ස් බැංකුවට ගෙවිය යුතු සියලුම ගෙවීම්, යම්කිසි අදාළ නීතියක් මගින් අවශ්‍ය වේ නම් හැර කිසිදු බද්දක් සඳහා හෝ ඒ මත අඩු කිරීමක් හෝ රඳවුමකින් තොරව සකසනු ඇත.

## 28. ගිණුම වසා දැමීම

කාගිල්ස් බැංකුව සහ/හෝ එහි අනුබද්ධිතයන් වෙත සේවාලාභියා විසින් සපුරාලිය යුතු වගකීමක් නොමැති නම් පමණක් කාගිල්ස් බැංකුව සමග ඇති ගිණුම වසා දැමීමේ/ අත්හිටුවීමේ අයිතිය ක්‍රියාත්මක කල හැකි බවට පාරිභෝගිකයා එකඟ වේ.

**29. අයිතීන් ප්‍රදානය**

මෙහි පැහැදිලි කර නොමැති කිසිදු ඕනෑම අයිතියක් අවශේෂණය කර ඇති අතර ඒවා සේවාදායකයා සඳහා හිමි නොවන බව සේවාදායකයා විසින් මෙයින් පිළිගෙන එකඟ වේ.

**30. සංශෝධන සහ වෙනස් කිරීම්**

වෙබ් අඩවියෙහි එවැනි සංශෝධන පිළිබඳව පැහැදිලි දැන්වීමක් පල කිරීම හෝ පාරිභෝගිකයා වෙත ලිඛිත දැනුම්දීමක් ලබා දීම හරහා දැනට පවතින ප්‍රතිපාදන හෝ කොන්දේසි වෙනස් කිරීම හෝ අවලංගු කිරීම, නව ප්‍රතිපාදනයක් හෝ කොන්දේසියක් එකතු කිරීම මගින් මෙහි දක්වා ඇති කොන්දේසි හා නියමයන් සිය තනි අභිමතය පරිදි සංශෝධනය කිරීම හෝ ආදේශනය කිරීම සඳහා හැකියාව ඇත. එවැනි දැනුම්දීමකින් අනතුරුව අන්තර්ජාල සේවාවන් අඛණ්ඩව බාවිතා කිරීම මගින් එම සංශෝධනය භාරගෙන පිළිගත් බවට සලකනු ලැබේ.

**31. බැඳී සිටීමෙහි පැවැත්ම**

මෙම කොන්දේසි හා නියමයන් යටතේ සිටින පාර්ශවයන්ගේ ඒ සඳහා ඇති බැඳී සිටීම මගින් ඕනෑම ගනුදෙනුවක් අවසන් වීමෙන් වැලකී සිටිය හැක.

**32. සාමුහික පිළියම්**

මෙම කොන්දේසි හා නියමයන්හි දක්වා ඇති පරිදි හැර, මෙම කොන්දේසි හා නියමයන්හි දක්වා ඇති අයිතීන්, බලය, පිළියම් හා වරප්‍රසාදයන්, නීතිය මගින් දක්වා ඇති අයිතීන්, බලය, පිළියම් හා වරප්‍රසාදයන් සමග සමුච්චිත වන අතර පරම නොවේ.

**33. අයිතීන් ඉවත් නොකිරීම**

මෙම කොන්දේසි හා නියමන් සම්බන්ධයෙන් ඕනෑම අයිතියක්, බලයක් හෝ වරප්‍රසාදයක් ලබා ගැනීමට අසමත් වීම හෝ ප්‍රමාද වීම ඉවත් කිරීමක් ලෙස ක්‍රියාත්මක නොකරනු ඇති අතර ඕනෑම අයිතියක්, බලයක් හෝ වරප්‍රසාදයක් සම්පුර්ණයෙන් හෝ කොටසක් ක්‍රියාත්මක කිරීමක්, කිසිඳු පසුකාලීන හෝ තව

දුරටත් සිදු කිරමට නියමිත ක්‍රියාත්මක කිරීමක්, එම අයිතිය, බලය හෝ වරප්‍රසාදය හෝ වෙනත් ඕනෑම අයිතියක්, බලයක් හෝ වරප්‍රසාදයක් වලක්වා ගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**34.** **විඡේද්‍යභාවය**

මෙම කොන්දේසි හා නියමයන් වල ඕනෑම විධිවිධානයක් හෝ නියමයක්, ඕනෑම නීතියක්, න්‍යායක්, පරිපාලන නියෝගයක් හෝ ඕනෑම අධිකරණයකින් හෝ නියාමනයකින් හෝ ස්වයං නියාමන ආයතනයකින් හෝ සංවිධානයකින් ලැබුණු නඩු තීන්දුවක් හේතුවෙන් අවලංගු හෝ ක්‍රියාත්මක කල නොහැකි තත්වයට පත් වේ නම්, එම අවලංගුභාවය හෝ ක්රියාත්මක කල නොහැකි වීම අදාළ වන්නේ එම විධිවිධානය හෝ නියමය සඳහා පමණි. අනෙකුත් විධිවිධාන හෝ නියමයන්ගේ වලංගුභාවය සඳහා එමගින් බලපෑමක් ඇති නොවනු ඇති අතර එවැනි අවලංගු කරන ලද හෝ ක්‍රියාත්මක කල නොහැකි කොන්දේසි හා නියමයන් මෙහි අන්තර්ගත නොවූවා සේ මෙම කොන්දේසි හා නියමයන් ඉදිරියට පවත්වාගෙන යා යුතුය.

**35.** **මාතෘකාවන්**

මෙම කොන්දේසි හා නියමයන්හි සඳහන් මාතෘකා වගන්තීන් පහසුව සඳහා පමණක් වන අතර එම මාතෘකා, අදාල කොන්දෙසියෙහි සාපේක්ෂ අර්ථය සඳහා බලපෑමක් ඇති නොකරයි.

**36.** **කොන්දේසි හා නියමයන්හි නීත්‍යානුකූලතාවය**

මෙම නියමයන් හා කොන්දේසි වල කාගිල්ස් බැංකුවෙහි ක්‍රියාකාරිත්වය පවත්නා නීති වලට හා නෛතික ක්‍රියාවලීන්ට යටත් වන අතර මෙම කොන්දේසි හා නියමයන්හි අඩංගු කිසිවක් රජයේ, අධිකරණ හා නීතිය බලාත්මක කිරීමේ ඉල්ලීම් හෝ පාරිභෝගිකයා විසින් මෙම වෙබ් අඩවිය භාවිතය හා සම්බන්ධ අවශ්‍යතා සඳහා අනුකූල වීමට හෝ එවැනි භාවිතයක් සම්බන්ධව කාගිල්ස් බැංකුව එකතු කර ලබා දුන් තොරතුරු පිලිබඳ කාගිල්ස් බැංකුවට ඇති අයිතියට හානි නොකරනු ඇත.

**37.** **පැවරිය නොහැකි බව**

පාරිභෝගිකයින් හෝ පරිශීලකයින් සඳහා අන්තර්ජාල සේවාවන් යටතේ ලබා දෙනු ලබන ඕනෑම පහසුකමක් කිසිඳු තත්වයක් යටතේ පැවරීමට නොහැක.

## 38. වගකීම් විරහිතභාවය

වෙබ් අඩවිය/අන්තර්ජාල සේවාවන් භාවිතය පිලිබඳ ඇති අවධානම තමා විසින්ම භාර ගන්නා බවට පාරිභෝගිකයා විශේෂයෙන්ම එකඟ වේ. ලබා දී ඇති වෙබ් අඩවිය/අන්තර්ජාල සේවාවන් ''සඳහන් කර ඇති පරිදි'' හා ''උපයෝජ්‍යතාව'' මත පදනම් වේ. කොන්දේසි හා නියමයන් තුල වලංගු ලෙස දක්වා ඇති පරිදි හැර, කාගිල්ස් බැංකුව වාණිජ්‍යකරණිහි ව්‍යංග වගකීම්, යම් අරමුණක් සඳහා යෝග්‍යතාව, දත්ත නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්වය සහ අන්තර්ජාල බැංකුකරණය තුල පවතින උල්ලංඝනය නොකිරීම හා සම්බන්ධ ඕනෑම වගකීමක් යන කරුණුද ඇතුලත්ව එහෙත් ඊට සීමා නොවී, නිශ්චිත, ව්‍යංග හෝ ව්‍යවස්ථාපිත ඕනෑම ආකාරයක සියලුම වගකීම් පැහැදිලිව ප්‍රතික්ෂේප කරනු ලබයි. වෙබ් අඩවිය සහ අන්තර්ජාල සේවාවන් වෙත ප්‍රවේශ වීම බාධාවකින් තොරව, කාලෝචිතව, ආරක්ෂිත හා දෝෂ රහිත වනු ඇති බවට කාගිල්ස් බැංකුව වගකියනු නොලැබෙන අතර වෙබ් අඩවිය මගින් හෝ අන්තර්ජාල සේවාවන් භාවිතයෙන් ලබා ගත හැකි ප්‍රතිඵල හෝ අන්තර්ජාල සේවාවන්හි නිරවද්‍යභාවය හෝ විශ්වාසනීයතාවය පිළිබඳවද වගකියනු නොලැබේ. වෙබ් අඩවිය හෝ අන්තර්ජාලය හරහා ඇතුලත් කරනු ලැබූ ගනුදෙනු පිළිබඳව කාගිල්ස් බැංකුව කිසිදු වගකීමක් ලබා නොදේ. අන්තර්ජාල සේවාවන් භාවිතයෙහි ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගිකයාගේ පද්ධතිය වෙත ඇතුළු විය හැකි වයිරස් පිලිබඳ කාගිල්ස් බැංකුව වග කිව යුතු නොවේ. අන්තර්ජාල සේවාවන් වයිරස් තර්ජනයන්ගේ තොර බවට පාරිභෝගිකයා වෙත හෝ වෙනත් තුන්වන පාර්ශවයක් වෙත කාගිල්ස් බැංකුව විසින් වගකියනු නොලැබේ.

## 39. ආයතනික අන්තර්ජාල බැංකුකරණය සඳහා ගිණුම සම්බන්ධ කිරීම

CIB අයදුම්පත්‍ර ආකෘතියෙහි සඳහන් කර ඇති ගිණුම් අංකය (අංක) ආයතනික අන්තර්ජාල බැංකුකරණය සඳහා සම්බන්ධ කරනු ඇති බවට පාරිභෝගිකයා විසින් එකඟ වේ. යම් ඕනෑම අවස්ථාවකදී පාරිභෝගිකයාහට ඉහත සඳහන් CIB අයදුම්පත්‍ර ආකෘතියට සම්බන්ධ කර ඇති ගිණුම් වලට අමතරව තවත් ගිණුම් (නව හෝ පැරණි) පවතී නම්, එම අවස්ථාවේදී පාරිභෝගිකයා විසින් එම සියලුම ගිණුම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දෙන ලෙස බැංකුව වෙත ඉල්ලුම් කල යුතු අතර එවැනි ප්‍රවේශ වීම් සඳහා පාරිභෝගිකයා මෙයින් එකඟ වේ.

අන්තර්ජාල බැංකුකරණ ගනුදෙනු, අතිච්ඡාදනය වන කාර්ය ප්‍රවාහ නීති තුලට අයත් වන බව පාරිභෝගිකයා මෙයින් එකඟ වී පිළිගෙන තහවුරු කරනු ලබයි. උදා: පහත දක්වා ඇති වර්ගයන්ගෙන් එකක් සඳහා අයත් වන අන්තර්ජාල බැංකුකරණ ගනුදෙනු:

I. තනි පරිශීලක අනන්‍යතාව (ගනුදෙනුව ඇතුලත් කරන්නා හා බලය ලබා දෙන්නා එකම පුද්ගලයෙකු විට)

II. ද්විත්ව පරිශීලක අනන්‍යතාව (ගනුදෙනුව ඇතුලත් කරන හා බලය ලබා දෙන පුද්ගලයින් දෙදෙනෙකු සිටින විට)

III. තෙවන පරිශීලක අනන්‍යතාව (ගනුදෙනුව ඇතුලත් කරන්නා හා බලය ලබා දෙනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු සිටින විට)

සහතික කිරීම්: පාරිභෝගිකයා විසින් නිශ්චිතව දක්වා සහ / හෝ වෙනත් ආකාරයක් තෝරා ගතහොත් හැර, අවම කාර්ය ප්‍රවාහ නීතිය යෙදවීම මගින් එවැනි ගනුදෙනු සැකසීමට/පිළිගැනීමට ලක් වනු ඇත. උදාහරණයක් ලෙස වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්, යම් අන්තරජාල බැංකුකරණ ගනුදෙනුවක් (3) වන වර්ගයට අයත් වන්නේ නම් සහ පාරිභෝගිකයා විසින් එවැනි ගනුදෙනුවක් (ගනුදෙනු) සඳහා කිසිදු කාර්ය ප්‍රවාහ නීතියක් තෝරා ගෙන / නිශ්චිතව දක්වා නොමැති නම්, පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව වෙත ලබා දී ඇති පරිශීලක අයිතීන්ට අනුව, එවැනි ගනුදෙනු යම් වර්ගයක් යටතේ; උදා; (2) වන වර්ගය යටතේ ද්විත්ව පරිශීලක අනන්‍යතාව අදාළ කරමින්, අවම කාර්ය ප්‍රවාහ නීතිය යෙදවීම මගින් සැකසීමට/පිළිගැනීමට ලක් වනු ඇත.

**40. වන්දි පූරණය**

කාගිල්ස් බැංකුවට එහි අධ්‍යක්ෂකවරුන් සහ සේවකයින් , නියෝජිතයින්, ක්‍රියා කරන්නන් හා එහි අනුබාද්ධිතයින්ට විරුද්ධව ගෙන එනු ලැබූ එවැනි හිමිකමක්, නඩු කටයුත්තක්, ක්‍රියාවක් හෝ වෙනත් ක්‍රියා පටිපාටියක් පහත සඳහන් අන්තර්ජාල සේවාවන් භාවිතා කිරීමත් සමග පදනම්ව හෝ ඒ හා සම්බන්ධව පන නගිනු ලබන බවට පත්වන තත්වය දක්වා, තුන්වන පාර්ශවයක් විසින් කාගිල්ස් බැංකුව, එහි අධ්‍යක්ෂකවරුන් සහ සේවකයින්, නියෝජිතයින්, ක්‍රියා කරන්නන් හා එහි අනුබද්ධිතයින්ට විරුද්ධව ගෙන එනු ලැබූ ඕනෑම හිමිකමක්, නඩු කටයුත්තක්, ක්‍රියාවක් හෝ වෙනත් ක්‍රියා පටිපාටියක් වෙනුවෙන් කාගිල්ස් බැංකුව, එහි අධ්‍යක්ෂකවරුන් සහ සේවකයින්, නියෝජිතයින්, ක්‍රියා කරන්නන් හා එහි අනුබාද්ධිතයින් සිය තනි වියදමින් වන්දි පූරණය කිරීමට, ආරක්ෂා කිරීමට, හානිකර නොවන ආකාරයෙන් තබා ගැනීමට පාරිභෝගිකයා එකඟ වේ.

I. පාරිභෝගිකයා විසින් මෙහි සඳහන් කොන්දේසි හා නියමයන් උල්ලංඝනය කිරීමක්

II. පාරිභෝගිකයා විසින් අන්තර්ජාල සේවාවන් වෙත සිදු කරන ඕනෑම මකා දැමීම්, එකතු කිරීම්, ඇතුලත් කිරීම් හෝ වෙනස් කිරීම් හෝ ඕනෑම අනවසර භාවිතයක්

III. පාරිභෝගිකයා විසින් මෙහි සඳහන් පරිදි ඕනෑම අවනිදේශනයක් හෝ නියෝජනය කිරීම් හෝ වගකීම් උල්ලංඝනය කිරීමක් හෝ

IV. පහත දක්වා ඇති ඕනෑම ගිවිසුමක් හෝ සේවාදායකයා විසින් ඉටු කිරීමට ඇති වගකීමක් කවර හෝ ආකාරයකින් උල්ලංඝනය කිරීමක්. සාධාරණ නීතිඥ ගාස්තු හා එයට එරෙහිව නියම කරනු ලබන හෝ එසේ නොමැති නම් ඒවාය යටත් වනු ලබන පිරිවැය හෝ එවැනි හිමිකම් පෑමක්, නඩු කටයුත්තක් සහ ක්‍රියාවක් හෝ එවැනි හිමිකම් පාමකට හේතු විය හැකි ක්‍රියා පටිපාටියක් නිසාවෙන් පැන නගින හෝ ඊට සම්බන්ධ පිරිවැය ද ඇතුලත්ව එහෙත් ඊට සිමා නොවී ඕනෑම සහ සියලුම පිරිවැය, හානි, වියදම්පාරිභෝගිකයා විසින් එකඟ වේ.

සාධාරණ නීතිඥ ගාස්තු හා එයට එරෙහිව නියම කරනු ලබන හෝ එසේ නොමැති නම් ඒවාය යටත් වනු ලබන පිරිවැය හෝ එවැනි හිමිකම් පෑමක්, නඩු කටයුත්තක් සහ ක්‍රියාවක් හෝ එවැනි හිමිකම් පාමකට හේතු විය හැකි ක්‍රියා පටිපාටියක් නිසාවෙන් පැන නගින හෝ ඊට සම්බන්ධ පිරිවැය ද ඇතුලත්ව එහෙත් ඊට සිමා නොවී ඕනෑම සහ සියලුම පිරිවැය, හානි, වියදම්පාරිභෝගිකයා විසින් එකඟ වේ. සියලු තත්වයන් යටතේ, නොසැලකිල්ලද ඇතුලත්ව එහෙත් ඊට සීමා නොවී,කඩ කිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් සඳහා වුවද, කාගිල්ස් බැංකුවෙහි සමස්ත අන්තර්ජාල සේවාවන් සම්බන්ධව ඇති හිමිකම් සඳහා වන සමස්ත වගකීම්, ගනුදෙනු වලට ගෙවනු ලැබූ ඕනෑම මුදලක් හැර, මීට පෙර මාස 12ක කාලසීමාව තුල අන්තර්ජාල සේවාවන් සඳහා පාරිභෝගිකයා විසින් ගෙවනු ලැබූ ගනුදෙනු ගාස්තු / අය කිරීම් හෝ සලකා බැලීම් සඳහා පමණක් සීමා විය යුතු බවට පාරිභෝගිකයා මෙයින් එකඟ වේ.

**41. ෆැක්ස් වන්දි පූරණය**

I. ආයතනික අන්තර්ජාල බැංකුකරණය හා සම්බන්ධ වගන්ති වල සඳහන් කර ඇති පරිදි හා කාගිල්ස් බැංකුව එකඟ වී ඇති වන්දි පූරණයක් වශයෙන් මාගේ / අපගේ වගකීම් ඉටු කිරීමට යටත්ව එවැනි ක්‍රියාවලියක් භාර ගැනීම සඳහා කාගිල්ස් බැංකුවෙන් ඉල්ලා ඇති පරිදි පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව වෙත මුරපදය සක්‍රීය කිරීම, පරිශීලක හැඳුනුම ක්‍රියාත්මක කරවීම, මුරපද නැවත සැකසීම, මුරපද නැවත නිකුත් කිරීම, විද්‍යුත් තැපැල් පණිවිඩ හැඳුනුම යාවත්කාලීන කිරීම, ජංගම දුරකථන අංක යාවත්කාලීන කිරීම හා සම්බන්ධ ෆැක්ස් සන්නිවේදනය හරහා ඉල්ලීම් හා උපදෙස් නිකුත් කිරීමට පිළිබඳව ඇති තම පහසුව හා උනන්දුව මත ක්‍රියා කරනු ඇත.

II. පහත සඳහන් කරුණු පාරිභෝගිකයා විසින් එකඟ වී, පිළිගෙන සහතික කර භාර ගනී.

a) ෆැක්ස් සන්නිවේදනය හරහා පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව වෙත කරනු ලැබූ හෝ පාරිභෝගිකයා විසින් කරනු ලැබූ බවට බොහෝදුරට විශ්වාස කරනු ලබන ඉල්ලීම් සහ උපදෙස්, කාගිල්ස් බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි ක්‍රියාවට නංවනු ඇත. පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව වෙත ෆැක්ස් සන්නිවේදනය හරහා එවනු ලබන එවැනි ඉල්ලීම් සහ/හෝ උපදෙස්, මින් මතුවට 'උපදෙස්' ලෙස හඳුන්වනු ඇත.

b) ඉහත සඳහන් කරනු ලැබූ පාරිභෝගිකයාගේ ඉල්ලීම මත ලබා දෙන උපදෙස් හෝ කාගිල්ස් බැංකුව විසින් ලබා දෙනු ලබන උපදෙස් වල යම් වෙනසක් සිදු වන අවස්ථාවේදී මෙම වන්දි පූරණයනොකඩවා වලංගුව පවතින බවට, පාරිභෝගිකයා මත පවතින හා ඒ සමග බැඳී සිටින බවට සහ උපදෙස් වලට සිදු කරනු ලබන යම් වෙනසක්, ලබා දී ඇති ඉඩ ප්‍රස්ථාව සහ වන්දි පූරණයෙහි පරිමාණය තුල සලකා බලන බවටත් පාරිභෝගිකයා විසින් අනුමත කර, එකඟ වී, පිලිගනී. කෙසේ වුවද, කාගිල්ස් බැංකුව දැනුම් දීමකින් තොරව ඉහත සඳහන් උපදෙස් නොසලකා හරිනු හෝ ඒවාට අනුව ක්‍රියා නොකර සිටීමට ඉඩ ඇත.

III. කාගිල්ස් බැංකුව වෙත ෆැක්ස් මගින් එවනු ලබන උපාදෙස් මත ක්‍රියා කිරීමට හැකියාව ඇත. එවනු උපදෙස් පැහැදිලි හා ව්‍යාකූල වුවද හෝ නොවූවද කාගිල්ස් බැංකුවෙහි තීරණය කාගිල්ස් බැංකුවෙහි සියලුම ක්‍රියාමාර්ගයන් තීරණාත්මක මෙන්ම පාරිභෝගිකයා සමග බැඳී පවතී.කාගිල්ස් බැංකුව සිය තනි අභිමතය පරිදි, ඕනෑම හෝ සියලුම උපදෙසක් මත ක්‍රියා කිරීම හෝ නොකිරීම සඳහා මෙම වගන්තියෙන් කිසිඳු අවහිරයක් සිදු නොවේ.

IV. ෆැක්ස් සන්නිවේදනය හරහා තොරතුරු සම්ප්‍රේෂණය කිරීම තොරතුරු සන්නිවේදනය සඳහා වන ආරක්ෂිත මාර්ගයක් නොවන අතර අනවසර භාවිතයන් හා ප්‍රවේශයන්, වංචනික හෝ වැරදි ලේඛනයන්, වැරදි නිවැරදි කර එවීම්, සම්පූර්ණ ලේඛනය හෝ එහි යම් කොටස් බැංකුව වෙත නොලැබීම් වලට යටත් වීමට ඉඩ ඇත. පහත සඳහන් එවැනි අවදානම් මේ සඳහා ඇතුලත් විය හැකි අතර, එහෙත් ඊට සිමා නොවේ.

a) අදාළ උපදෙස් වංචනික ලෙස ලියා තිබීම හෝ වෙනස් කර තිබීම.

b) කාගිල්ස් බැංකුව වෙත ලැබෙන උපදෙස් අවුල් සහගත තත්වයට පත්වී තිබීමට හෝ වැරදි ලෙස වටහා ගැනීමට හැකි වන ආකාරයෙන් පැවතිය හැකි වීම.

c) කාගිල්ස් බැංකුව වෙත අදාළ එම උපදෙස් නොලැබීම හෝ කාගිල්ස් බැංකුවෙහි සාමාන්‍ය වැඩ කරන බැංකු වේලාවන් තුල නොලැබීම හෝ උපදෙස් ලබා දෙන වේලාවේදී ෆැක්ස් යන්ත්‍රය භාවිතයෙන් තොරව පැවතීම සහ / හෝ කාගිල්ස් බැංකුව වෙත එම උපදෙස් වලින් කොටසක් පමණක් ලැබීම.

d) උපදෙස් වටහා ගැනීමේදී වැරදි සහගත ලෙස වටහා ගැනීමට ඉඩ පැවතීම.

V. කාගිල්ස් බැංකුව වෙත පළමුවෙන් ලබා දී තිබූ උපදෙස් මත මේවන විට ක්‍රියා කිරීම ආරම්භ කර පැවතියද (අගතියකින් තොරව පසුව ලබා දෙන උපදෙසක්, ලිඛිත නියෝගයක් හෝ විධිවිධානයක් ලබා ගෙන සහ ඒ අනුව ක්‍රියා කර තිබූ අවස්ථාවක) හෝ උපදෙස් ලබා ගැනීම සඳහා නිශ්චිතව දක්වා ඇති පහසුකම් අත්හිටුවීම හෝ නතර කර තිබුනද, පාරිභෝගිකයා විසින් පසුව ලබා දුන් උපදෙස් මගින් පාරිභෝගිකයා විසින් පෙරදී ලබා දුන් උපදෙස් හෝ ලිඛිත නියෝග හෝ විධිවිධාන අවලංගු වේද, ෆැක්ස් සන්නිවේදනය හරහා කාගිල්ස් බැංකුව වෙත ලබා දුන් උපදෙස් අනුගමනය කිරීමේදී කාගිල්ස් බැංකුවෙහි සියලුම හෝ ඕනෑම ක්‍රියාමාර්ගයක් සමග පාරිභෝගිකයා අඛණ්ඩව බැඳී සිටී.

VI. පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව වෙත ෆැක්ස් සන්නිවේදනය හරහා එවනු ලැබූ උපදෙස පිළිගනිම සහ ඒවාට අනුව ක්‍රියා කිරීම හේතුවෙන් ඇතිවන හා විඳීමට සිදුවන නීතිමය වියදම් ද ඇතුළුව සියලුම හිමිකම්, පාඩු, හානි, පිරිවැය වලින් කාගිල්ස් බැංකුව වන්දි පූරණය කිරීමට හා හානිකර නොවන අන්දමින් වන්දි පූරණය කර තැබීමට සහ ආරක්ෂා කිරීමට පාරිභෝගිකයා එකඟ වේ.

VII. කුමන හෝ ආකාරයේ වුවද ඕනෑම හේතුවක් මත ෆැක්ස් සන්නිවේදනය හරහා ලබා දෙනු ලැබූ උපදෙස් මත සිදු කරන ඕනෑම ක්‍රියාවක් / පැහැර හැරීමක් සඳහා පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකුව වෙත වගකීම නොපැවරිය යුතුය.

**42. බැංකුවෙහි ඇපයට තබා ගැනීම**

වෙනත් ඕනෑම ඇපයට තබා ගැනීමක් හෝ ගාස්තුවක් නොසලකා, පාරිභෝගිකයාගේ තනි නමින් පවතින හෝ බද්ධ ගිණුමක් ලෙස පවතින ප්‍රාථමික සහ / හෝ ද්විතීක ගිණුමෙහි (ගිණුම් වල) හෝ වෙනත් ඕනෑම ගිණුමක ඇති තැන්පතු මුදල් මත කුමන ආකාරයෙන් හෝ පාරිභෝගිකයා විසින් අන්තර්ජාල බැංකුකරණ සේවාවන් දීර්ඝ කිරීමෙහි සහ/හෝ භාවිතා කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සම්පූර්ණ හිඟ මුදල දක්වා වර්තමාන මෙන්ම අනාගත වශයෙන් ඇපයට තබා ගැනීමට හා පියවා ගැනීමට කාගිල්ස් බැංකුවට අයිතිය හිමි වේ.

**43. අනුපාතික බලපෑම**

මෙහි සඳහන් කර ඇති කාගිල්ස් බැංකුවෙහි වගකීම්, එම වගකීම් ඉටු කිරීම වලක්වා ගැනීම හෝ ප්‍රමාද වීම හෝ බාධා කිරීම යම් අනුපාතික බලපෑමක් [යම් සන්නිවේදන පද්ධතියක් උපයෝජ්‍යතාවයෙන් තොර වීම,

කඩාකප්පල්කාරී ක්‍රියාවන්, ගිනි ගැනීම්, ගංවතුර, පිපිරීම්, දේව ක්‍රියාවන්, සිවිල් කැළඹීම්, වර්ජන හෝ ඕනෑම ආකාරයක කැරැල්ලක්, කෝලාහල, යුධමය තත්ත්ව හෝ ආණ්ඩුවෙහි ක්‍රියාකාරකම්, නීති පද්ධතියෙහි සහ වෙනත් සමාන ආකාරයේ නියාමන ස්වාභාවයන්හි වෙනස්කම් ද ඇතුලත්ව එහෙත් ඊට සීමා නොවී, කාගිල්ස් බැංකුවෙහි සාධාරණ පාලනය ඔබ්බට පවතින ඕනෑම සිදුවීමක් ඇතුලත් වේ.]හේතුවෙන් සිදු වන්නේ නම්, සිය වගකීම් ඉටු කිරීම වලක්වා ගැනීම හෝ ප්‍රමාද වීම හෝ බාධා කිරීම හේතුවෙන් ඇතිවන ඕනෑම සිදුවීමකට යටත් වනු ඇති අතර එම ඕනෑම හේතුවක් හෝ බලපෑමක් සාධාරණ කාල පරිච්චේදයක් තුල නොනැසී පවතින තුරු [මෙම විධිවිධානය යටතේ පමණක් ගෙවිය යුතුව පවතින ඕනෑම හිඟ මුදලක් මත මෙම පොලී උපචිත ලෙස උපයෝගී කර ගත යුතු නොවේ.]සපුරාලිය හැකි එවැනි වගකීම් තුල කාගිල්ස් බැංකුව විසින් සිදු කරන ලද පැහැර හැරීමක් ලෙස සලකනු නොලැබේ. මෙහි සඳහන් කරුණු සඳහා වගකීම් ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් ඕනෑම පාර්ශවයක් මගින් සිදු වන ඕනෑම ක්‍රියාවක් හෝ හිමිකමක් කාගිල්ස් බැංකුව වගකිවයුතු නොවේ.

## 44. පොදු

සේවාලාභියා විසින් වෙනත් කිසිඳු අයෙකු වෙත මෙම කොන්දේසි හා නියමයන් භාර දිය නොහැක. කාගිල්ස් බැංකුව මෙම කොන්දේසි හා නියමයන් යටතේ සිය වගකීම් ඉටු කිරීමට උප කොන්ත්‍රාත්තු සහ නියෝජිතයින් යෙදවීමට ඉඩ ඇත. කාගිල්ස් බැංකුව විසින් මෙම කොන්දේසි හා නියමයන් යටතේ සිය අයිතීන් සහ වගකීම් කාගිල්ස් බැංකු සමුහයෙහි ඕනෑම සමාගමක් වෙත මාරු කිරීම හෝ පැවරීම සිදු කිරීමට ඉඩ ඇත.

කාගිල්ස් බැංකුවෙහි සමස්ත ගිවිසුම මෙම කොන්දේසි හා නියමයන් ඇතුලත් වන අතර ආයතනික අන්තර්ජාල බැංකුකරණ සේවාවන් සඳහා කාගිල්ස් බැංකුව සහ පාරිභෝගිකයා අතර වාචිකව හෝ ලිඛිතව පෙර සකස් කරන ලද ඕනෑම යෝජනාවක්, නියෝජනයක්, අවබෝධයක් සහ ගිවිසුමක් අවලංගු වීම හා ප්‍රතිස්ථාපනය ප්‍රකාශ හෝ ගම්‍ය වේ. කාගිල්ස් බැංකුව විසින් සිදු කරන ලද කිසිඳු නියෝජනයක් හෝ එහි කිසිඳු සේවකයෙකු හෝ නියෝජිතයෙකු මත විශ්වාසය තබා නොමැති බව සහ ආයතනික අන්තර්ජාල බැංකුකරණය පිලිබඳ ස්වාධීන ඇගයුමක් කර ඇති බවට පාරිභෝගිකයා විසින් පිළිගනී. මෙම කොන්දේසි හා නියමයන් යටතේ කිසිදු තුන්වන පාර්ශවයක් සඳහා අයිතීන් හා හිමිකම් හිමි නොවේ.

## 45. කොන්දේසි වල යෝග්‍යතාවය

මෙම කොන්දේසි හා නියමයන්, අන්තර්ජාල බැංකුකරණ සේවාවන් භාවිතා කරන පාරිභෝගිකයා සහ කාගිල්ස් බැංකුව අතර ගිවිසුමක් ඇති කරයි. අන්තර්ජාල බැංකුකරණ සේවාවන් සඳහා අයදුම් කිරීම මගින් සහ එම සේවාවට ප්‍රවේශ වීම මගින් පාරිභෝගිකයා විසින් මෙම කොන්දේසි හා නියමය පිළිගෙන

භාර ගනු ලබයි. මෙම කොන්දේසි හා නියමයන්, පාරිභෝගිකයාගේ ගිණුම් සඳහා අදාළ වන කොන්දේසි හා නියමයන්ට අමතරව පවතින අතර ඊට හානි වන අයුරින් නොපවතී.

## 46. තනි පුද්ගලයින් හා තනි පුද්ගල ව්‍යාපාරහිමියන් සඳහා කොන්දේසි වල යෝග්‍යතාවය

ආයතනික අන්තරජාල බැංකුකරණ සේවාවන් ලබා ගනු ලබන තනි පුද්ගලයින් සහ හිමිකරුවන් වන පාරිභෝගිකයින් සඳහා පහත සඳහන් කොන්දේසි හා නියමයන් ('කොන්දේසි') අදාළ වේ. මෙම කොන්දේසි, ඉහත දක්වා ඇති ආයතනික අන්තර්ජාල බැංකුකරණය සඳහා බල පැවැත්වෙන කොන්දේසි හා නියමයන්ට (ප්‍රාථමික කොන්දේසි හා නියමයන්) අමතරව පවතින අතර ඊට හානි වන අයුරින් නොපවතී. ප්‍රාථමික කොන්දේසි හා නියමයන් සහ මෙම කොන්දේසි අතර යම් අනනුකූලතාවයක් ඇති වූ අවස්ථාවකදී කොන්දේසි තවදුරටත් පවතිනු ඇත. මෙහි අර්ථදක්වා නොමැති ඉංග්‍රීසි කැපිටල් අකුරින් දක්වා ඇති පද සඳහා ප්‍රාථමික කොන්දේසි හා නියමයන් සඳහා දක්වා ඇති තේරුම එලෙසම අදාළ වේ.

I. අර්ථදැක්වීම්

ගනුදෙනු වෙත ප්‍රවේශය යනුවෙන් සාමාන්‍ය බැංකුකරණ, SLIPS හෝ CEFT භාවිතයෙන් තමාගේම ගිණුම වෙත මුදල් හුවමාරු කිරීම් (කාගිල්ස් බැංකුව තුල), තුන්වන පාර්ශවයන් වෙත තනි/බහු මුදල් හුවමාරු (කාගිල්ස් බැංකුව තුල), තුන්වන පාර්ශවයන් වෙත තනි/බහු මුදල් හුවමාරු (කාගිල්ස් බැංකුවෙන් පිටත) අදහස් වේ.

II. ගනුදෙනු වෙත ප්‍රවේශය භාවිතය සඳහා කොන්දේසි ; පාරිභෝගිකයා වෙත පෙරනිමි ගනුදෙනු ප්‍රවේශයක් ලබා දෙනු ඇත. මෙම ගනුදෙනු ප්‍රවේශය, තනි පුද්ගලයින් සහ තනි පුද්ගල ව්‍යාපාරහිමියන් වන සියලුම පාරිභෝගිකයින් සඳහා සම්මත ප්‍රවේශයක් වනු ඇත.

ආයතනික අන්තර්ජාල බැංකුකරණය භාවිතයෙන් ගනුදෙනු සිදුකරනු ලබන පාරිභෝගිකයින්හට CIB අයදුම්පත්‍රයෙහි ඔවුන් විසින් ලබා දී ඇති මුදල් ප්‍රමාණය දක්වා භාවිතා කිරීමේ හැකියාව පවතී. එම මුදලට වැඩි මුදක් ප්‍රමාණයක් දක්වා ගනුදෙනුවක් සිදු කිරීමට අවශ්‍ය වූ අවස්ථාවකදී , පාරිභෝගිකයා විසින් කාගිල්ස් බැංකු ශාඛාවක් හරහා අදාළ වෙනස් කිරීමේ ඉල්ලීම ලබා දිය යුතුය.

ගනුදෙනු ප්‍රවේශය භාවිතා කිරීම සඳහා, පාරිභෝගිකයා විසින් ඔවුන්ගේ ජංගම දුරකථන අංක ලියාපදිංචි කිරීමට අවශ්‍ය වන අතර එසේ කිරීමට අපොහොසත් වීම මගින් මුදල් හුවමාරු කිරීමේ විකල්පය භාවිතය සඳහා නොපවතිනු ඇත.

## 47. බලයලත් අත්සන්කරුවන් ඉවත් කිරීම සඳහා අදාළ වන කොන්දේසි

පහත සඳහා කොන්දේසි හා නියමයන් ('කොන්දේසි') බැංකුව වෙනුවෙන් තම බලයලත් අත්සන්කරුවන් ඉවත්කිරීම සඳහා අයදුම් කරනු ලබන  CIB පාරිභෝගිකයින් සඳහා අදාළ වේ.

I. තම ජංගම ගිණුමින් බලයලත් අත්සන්කරුවකු/අත්සන්කරුවන් ඉවත්කිරීම සඳහා පාරිභෝගික අයදුම්පතක් බැංකුව වෙත ලැබුණහොත්, බැංකුව විසින් එය සමස්ත ඉල්ලීමක් ලෙස සලකා, පාරිභෝගිකයා විසින් ලිපියක් මගින් ඒ පිළිබඳව විශේෂ උපදෙස් ලබා දී නොමැති නම් CIB වෙතින්ද අදාළ අත්සන්කරුවා/ අත්සන්කරුවන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

II. CIB අයදුම්පතෙහි අත්සන ඉවත් කිරම ක්‍රියාවට නැංවුවහොත් ඉන් පසු එය CIB පත්‍රය මත ගනුදෙනුකරුගේ කාර්ය ප්‍රවාහ සැකසුම වෙත බලපෑමට ඉඩ ඇත. මෙවන් අවස්ථාවකදී, අත්සන ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන කාර්ය ප්‍රවාහ වෙනස පිලිබඳ බැංකුව විසින් වගකියනු නොලැබේ.